HNB GRAMEEN
# මෙහෙවර
අඳුර දුරලන සොඳුරු මෙහෙවර
2017 මැයි - ජූනි කලාපය




ඡායා.
නිර්මාණ ගුණසේකර

## කුළුඳුල් වරමින් ජය ධජ බන්දා ග්‍රාමීන් විරුවන් කිරුළ ගෙනාවා...

2017 අප්‍රේල් මස 01 වැනිදා HNB ග්‍රාමීන් සමාගම මූල්‍ය ක්ෂේත්‍රයේ ජයග්‍රහණයකට එහා ගිය මහා විජයග්‍රහණයක් ලද දිනයක් බව අප කාටත් මතක තිබේ. පුරා මාස 06 කට අධික කාලයක් තුළ ලද පුහුණුවීම් තුළින් නෙලාගත් අග්‍ර ඵලය ලෙස අප ලෙදර් පන්දු ක්‍රිකට් කණ්ඩායම වෙළෙඳ සේවා ක්‍රිකට් තරගාවලියේ ඊ කොටසේ ශූරයින් ලෙස කිරුළු පැළඳුහ. මේ ඒ පිළිබඳව තබනු ලබන කෙටි සටහනකි.

දිවයින පුරා විසිර සිටි ක්‍රිකට් ක්‍රීඩාවට දක්ෂ ක්‍රීඩකයින් සොයා ගනිමින් ඒ වගේම අත්දැකීම් සපිරි පුහුණුකරුවකුගේ මග පෙන්වීම කණ්ඩායමට ලබාදෙමින් මෙවර වෙළෙඳ සේවා ක්‍රිකට් ඊ කාණ්ඩය යටතේ අප කණ්ඩායම තරග වැදුනා. මුල් වටයේ පවත්වන ලද තරග 5 න් තරග පහම ජයග්‍රහණය කරමින් අප කණ්ඩායම මූලික අර්ධ අවසන් වටයට පිවිසීමට සමත් වූවා. රෙග්නිස් ලංකා පී එල්සී, එමාර්කෙම් එන් බී, ඒ අයි ඒ ඉන්ෂුවරන්ස්, මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්, අමානා බැංකුව වැනි මීට පෙර තරගාවලියට සහභාගිවී සිටි අත්දැකීම් සපිරි කණ්ඩායම් පරාජයට පත් කිරීමට අප කණ්ඩායමට හැකියාව ලැබී තිබුණා. එමෙන්ම මූලික වටයේ තරගවලින් සමස්ථ කණ්ඩායම් 35 කින් ප්‍රසාද ලකුණු සහ දළ ලකුණු වේගය අනුව පළමුවැනි කණ්ඩායම බවට පත්වෙමින් ශූරතාවය පිළිබඳ මූලික අනාවැකිය පල කිරීමට අප කණ්ඩායමට වරම් වාසනාවද ලැබී තිබුණු බව අවිවාදයෙන්ම පිළිගත යුත්තකි.

3 පිටුවට

# ජීවිතයට අරුතක්






ඔබගේ මගේ හැම කෙනෙකුගේම පැතුම වනුයේ තම ජීවිතයේ ළඟා විය හැකි උපරිම තලයට ළඟා වීමයි. එය රැකියාව හරහා හෝ ව්‍යාපාරයක් හරහා විය හැක. එලෙස තම ජීවිතය කුඩා තැනකින් අරඹා ලෝකයම දන්නා මහා ධන කුවේරයකු බවට පත්වූ බිල්ගේට්ස්ගේ ජීවන ගමන ගැන අපි අද සාකච්ඡා කරමු.

බිල්ගේට්ස් යන නාමය බොහෝ දෙනෙකුට හුරුපුරුදු නමකි. ඔහු ලෝක ප්‍රකට මයික්‍රොසොෆ්ට් සමාගමේ හිමිකරුවේ. මොහුගේ පවුල් පසුබිම හොඳ මට්ටමක පැවතුණි. නමුත් එම පවුල ව්‍යාපාර ලෝකයට හෝ පරිගණක අංශයට කිසිදු සබඳතාවයක් නොවිණි.

ඔහුගේ පියා වෘත්තියෙන් නීතීඥයෙක් හා අම්මා ගුරුවරියක් වූවාය. දෙමාපියන් වෘත්තිකයින් වුවත් බිල්ගේ සිහිනය වූයේ කා යටතේ හෝ රැකියාවක් කිරීම නොව තමාගේම කුමක් හෝ ව්‍යාපාරයක් කිරීමය.

බිල් මුල් වරට ඇස් දෙකට පරිගණකයක් දුටුවේ ඔහුගේ වයස අවු. 13 දීය. ඒ ඔහු ඉගෙන ගත් පාසලේ දී. එය පාවිච්චි කිරීමට පාසැලේ යම් මුදලක් අය කළා. මුදල් ඇති සෑම විටකම ඔහු මුදල් ගෙවා පරිගණකය පරිහරණය කළා. නමුත් සමහර අවස්ථා වල ඔහුට මුදල් නොමැති විය. එවැනි අවස්ථාවල ඔහු එය හැක් කර පාවිච්චි කිරීමට ක්‍රමයක් සොයාගෙන එය යම් කාලයක් කරගෙන ගියා. පසුව මෙය පාසල දැනගෙන පාසලින් නෙරපා දැමුවා. නමුත් පසුව විදුහල්පතිතුමා මෙය දැනගෙන ඔහුගේ හැකියාව ගැන පුදුමයට පත් වී ඔහුව පරිගණකයේ ඇතිවන දෝෂ නිරාකරණය කරන සිසුවා බවට පත්කළා. එය බිල්ට ඉතා සතුටුදායක ආරම්භයක් විය. පාසල් අධ්‍යාපනය හරහා විභාගයට වාඩි වී ලකුණු 1600කින් 1590 ක් ලබා ගැනීමට මේ කාර්යශූර බිල් ගේට්ස් සිසුවා සමත්විය. ඒ නිසාම ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයට සුදුසුකම් ලැබීය.

මේ අතරතුර එක්තරා සමාගමක් පරිඝනක භාෂා මිලට ගන්නා බව දක්වමින් දැන්වීමක් පළකර තිබුණා. එම දැන්වීමට බිල් කථා කර මා සතුව පරිගණක වැඩ සටහනක් පවතින බවත් එය අලෙවි කිරීමට කැමති බවත් කියා සිටියා. එයට සමාගම එකඟ විය. ඒ වන විට ඔහු සතුව කිසිදු පරිගණක වැඩ සටහනක් නොවූ අතර සමාගමේ එකඟතාවය මත වහ වහා පරිගණක වැඩසටහනක් ලියා අවසන් කරන ලදී. මොහු තමාගේ පාසල් මිතුරුකැළ ද සමඟ එකතු වී මෙය ඉතා ඉක්මනින් නිමකරන ලදී.

ඔහුගේ දැඩිකැපවීම කොතරම් ද යත් දවසේ වැඩ අවසන් වී ඔහු වැඩ කළ මේසය මතම හිස තබාගෙන නිදාගෙන නැවත අවදි වූ පසු එතැන් සිටම තම ඉලක්කය සපුරන තෙක්ම වැඩ කළේය. මෙම පරිගණක වැඩ සටහන සැකසුවේ හාවඩ් විශ්ව විද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා වූ අතර එහි 50% ක් ම සෘජු දායකත්වය බිල්ගේ විය. මෙම පරිගණක වැඩ සටහන අවසන් වූ වහාම ඔහු pasic නමැති පරිගණක භාෂාව සැකසීය. එය Altair සමාගමට අලෙවි කළ අතර හිමිකම තමා සතුවම තබා ගන්නා ලදී. ඉන්පසුව ලෝක ප්‍රසිද්ධ වූ IBM සමාගම බිල් ගේට්ස්ගෙන් මෙහෙයුම් පද්ධතියක් සැකසීමට හැකිදැයි විමසන අතර ඔහු ක්ෂණයෙන් ඔව් මට පුළුවන් කරල දෙන්න කියා නොබියව කියා සිටිනවා. නමුත් ඔහු ඒ වන විට මෙහෙයුම් පද්ධති Creating System ගැන කිසිදු අවබෝධයක් ලබා නොතිබූ බව බිල් පවසනවා.

ඒ සමඟම ඔහු මෙය සැකසීමට නොදන්නා නිසා එය සකසා දෙන හෝ සැකසිය හැකි කෙනෙක් සොයාගෙන ඔහුගෙන් එය අයිතිය ද සමඟ සම්පූර්ණයෙන්ම මිලට ගන්නවා. පසුව බිල් මෙය ඔහුගේ නිපදවීමක් ලෙස IBM ආයතනයට ඉහළ මිලකට අලෙවි කරනු ලැබීය. එය IBM සමාගමට විකුණනවා පමණක් නොව එහි අයිතිය ද බිල් සතුවම තබා ගන්නා ලදී.

මේ කාලයේ IBM සමාගම මෙන්ම Apple සමාගම ද ඉහළ නමක් දිනාගන සිටි ආයතන 2 ක්. Apple හිමිකරු වන ස්ටීව් ජොබ්ස්ට බිල් ලවා අළුත් පරිගණක වැඩසටහනක් ලියවා ගැනීමට අවශ්‍ය විය. පසුව බිල් Apple සමාගමේ කණ්ඩායම් නායකයකු බවට පත්විය. නමුත් ජොබ් තුළ බිල් ගැන කිසිදු පැහැදීමක් ඇති නොවීය. නමුත් බිල් ඉතා රහසිගත ලෙස එම Apple සමාගමට අවශ්‍ය වූ පරිගණක වැඩසටහන නොවනවත්වාම සකස් කර ගෙන යන ලදී.

බිල්, ස්ටීව් ජොබ්ගේ අදහස් වලට අවනත වී වැඩ කිරීමට කිසිදු කැමැත්තක් නොදැක්වීය. මේ අතර තුර ස්ටීව් ජොබ් බිල්ට පැවරූ රාජකාරිය නිසි ලෙස ඉටු නොකළ නිසා Xerox සමාගමෙන් එම පරිගණක වැඩසටහන වංචා සහගත විදිහට ස්ටීව් ජොබ්ගේ නිර්මාණයක් ලෙස එළිදැක්වීමට ලබා ගන්නා ලදී. බිල් ගේට්ස් ඒ වන විටත් ස්ටීව් ජොබ් ළඟ වැඩ කළ නිසා එම පරිගණක වැඩසටහන සොරාගන්නවා. එම සොරා ගත් වැඩසටහන අවසානයේ බිල් ගේට්ස් නම් කලේ windows ලෙසයි.

ස්ටීව් ජොබ් මේ පිළිබඳ ආරංචි වූ වහාම ඔහු දැඩිසේ කිපී සේවකයින් ඉදිරියේම බිල්ට බැනවැදුනි. නමුත් බිල් ඉන් නොසැලී ''මම සොරකම් කලේ ඔබත් සොරකම් කළ දෙයක්'' යනුවෙන් පවසනවා. ඉන්පසුව බිල්ගේ සිහිනය වූයේ වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය සෑම නිවසකම තිබෙනවා දැකීමටයි. එම සිහිනය සැබෑවක් කරමින් Apple සමාගම අභාවයට යද්දී මයික්‍රොසොෆ්ට් සමාගම දිනෙන් දිනම කෝටිපති ආදායම් උපයන ජාත්‍යන්තර සමාගමක් බවට පත්වෙනවා ඒ වනවිට බිල්ගේ වයස යන්තම් අවුරුදු 39යි. එනම් වයස 39 දී ඔහු ලෝකයේ ධනවත්ම පුද්ගලයා බවට පත්වනවා. අද වනවිට ඔහුගේ මුළු ධනස්කන්ධය ඩොලර් බිලියන 90 ක්. ලෝක ධනපතියා ලෙස එක දිගටම වසර 11 ක්ම පත්විය. අද වන විට ඔහුගේ ධනය අප රටේ දළ දේශීය නිෂ්පාදනයට සමාන වී ඇත. එනම් අප රටේ කෝටි දෙකක් පමණ වන ජනගහණයක් වාර්ෂිකව නිපදවන වටිනාකමට සමාන ධනයක් ඔහු සතුවන නිසාය. දැනට ඔහුගේ වයස අවුරුදු 60 කි. ඔහුට දරුවන් තිදෙනෙකු සිටියි. ආර්ථික විශේෂඥයින්ගේ මතය අනුව එම ධනස්කන්දය වියදම් කිරීම සඳහා එනම් කිසිදු ආදායමක් නොසොයා වසර 218 පමණ වැය වන බවයි. එසේම බිල්ගේට්ස්ට ඔහුගේ ධනයෙන් මිහිතලය මත සිටින සෑම අයෙකුටම ඩොලර් 15 ක් ලබා දිය හැකි අතර ඉන් පසුවද ඔහු සතුව ඩොලර් මිලියන 5 ක් ඔහුට ඉතිරි වනවා ඇත. එසේම බිල්ගේට්ස්ගේ අතින් ඩොලර් 1000 නෝට්ටු බිම් වැටුනහොත් එය ඇහිද ගැනීමට මහන්සි වන තත්පර 4 තුළ ඔහුට තවත් ඩොලර් 1000 එකතුවේ. එය ඔහුගේ ආදායම් ඉපයීමේ ශක්තියයි. තවද ඇ. එ. ජ. යේ මුළු ණය බර ඇ. ඩො. ට්‍රිලියන 5.62 කි. මෙය බිල්ගේට්ස්ගේ ධනපති තත්වය මත වසර 10ක දී ගෙවා නිමකල හැකි බව දැක්වේ.

එසේම බිල්ගේට්ස් තවත් වසර 35 ක් ඉදිරියට ජීවත් වෙනවා යයි සිතුවහොත් ඔහුගේ සියළුම ධනය අවසන් කිරීමට දිනකට ඇ. ඩො. මිලියන 6.78 වැය කළ යුතු වෙනවා ඇත.

එසේම බිල්ගේට්ස් පුද්ගලයකු නොවී රටක් ලෙස සැලකුවේ නම් ඔහු ලෝකයේ ධනවත්ම රටවල් අතරින් 37 වන ස්ථානයේ පසුවනවා ඇත.

මෙලෙස අප මුළු ලොවම හොඳින් දන්නා බිල්ගේට්ස්ගේ විශ්මිත බව අප සැමට වැටහේ. ඔහුගේ මේ ගමනේ දී තම හාවඩ් විශ්ව විද්‍යාලයේ උපාධිය පවා කැප කළේය. එසේම ලෝකයේ හදවත් රෝගීන්ට වැඩිපුරම ආධාර කරන සංවිධාන හා පුද්ගලයින් අතරින් පුමුඛයා වන්නේ ද බිල් ගේට්ස්ය. මෙවැනි මිනිසුන් මේ උපයන ධනයෙන් සැලකිය යුතු මුදලක් ලෝකයේ උදව් අවශ්‍ය අය වෙනුවෙන් වැය කරයි. මෙවැනි ආදර්ශවත් මිනිසුන්ගේ ගුණධර්ම හා හැකියාවන් අපත් අප ජීවිතයට ඇතුලත් කරගෙන ජීවිත සාර්ථකත්වයට රැගෙන යාමටත් අන් අයට ශක්තියක් ලබා දීමටත් උර දී කටයුතු කිරීමට අධිටන් කර ගත යුතුය.

## හැකර් කෙනකු ලොව පළමු පෙළේ කෝටිපතියෙකු වෙයි.



**ප්‍රේමසිරි ගමගේ**
සභාපති, ව්‍යාපාර සංවර්ධන කේන්ද්‍රය.

**සෑම දෙයකටම මූල ධර්මයක් ඇත. එය දැනගැනීම ඉතා වැදගත්ය.**

# IQ MASTER දැනුමෙන් දිනුම ලැබූ ජයග්‍රහකයෝ

**HNB** ග්‍රාමීන් සමාගමේ සේවයේ නියුතු අප කාර්ය මණ්ඩලයේ සේවකයන් ගේ දැනුම සහ කුසලතාව ඔප් නැංවීමේ අරමුණින් සංවිධානය කරන ලද **IQ Master** දැනුමෙන් දිනුම තරගයේ පළමු වටයේ තරගය පසුගියදා පවත්වනු ලැබූ අතර ඉන් අවසාන මහා තරගයට තේරුණු ජයග්‍රාහී තරගරුවන් පහළොස් දෙනා මෙසේය.ඔවුන්ගේ ජයග්‍රහනය වෙනුවෙන් අපගේ සුභාෂිංශන එක්කරන අතර **IQ Master** අවසාන මහා තරගය තව නොබෝ දිනකින් පැවැත්වීම සඳහා කටයුතු ලහි ලහියේ සැලසුම් කෙරෙමින් පවතින බව සතුටින් යුතුව දැනුම් දෙමු.


අමල් තිලන්ක කස්තුරි අරච්චි


මලින්ද අයේශාන් කුමාර


රජිත් ශාන්ත ධර්මප්‍රිය


හෙට්ටිආරච්චිගේ ඩිශාන් සමින්ද


වගීෂා යසේන්ද්‍රී අබේවික්‍රම


අමිල ප්‍රභාත් අරියරත්න




මයුර මදුශාන් ප්‍රනාන්දු


සංජීව චතුරංග


කසුන් බුද්ධික බන්ඩාර හපුවිට


ඉන්දික සම්පත්


තුෂාන් චන්දන රත්නායක


සුමුදු මහීල් මුනසිංහ


චරන්ද පුෂ්ප කුමාර


තිලින සංජීව


සුබ්‍රමනියම් විමලන්




## කවරයේ කතාව

මූලික අර්ධ අවසන් පූර්ව වටයේදී බ්‍රැන්ඩික්ස් එසෙන්ෂියල් සමාගම ලකුණු 80 කින් පරාජය කරමින් අර්ධ අවසන් පූර්ව වටයට පිවිසුණු අප එහිදී තරග වැදුණේ දක්ෂ ජෝන් කීලස් සමාගම සමගයි. එම තරගයද ලකුණු 81 කින් ජයග්‍රහණය කළ අප කණ්ඩායමට මූලික වටයේදීද අපගෙන් පරාජය ලැබූ මර්කන්ටයිල් ඉන්වෙසට්මන්ට් සමාගම සමග අවසන් පූර්ව වටය සඳහා තරග වැදීමට සිදුවුණා.එහිදී කඩුළු 02 ක තියුණු ජයක් ලබාගත් **HNB** ග්‍රාමීන් කණ්ඩායම අවසන් මහා තරගය සඳහා සුදුසුකම් ලැබුවා. කණ්ඩායමක් වශයෙන් ක්‍රීඩා කළ ක්‍රීඩකයින් අතරින් සුවිශේෂී දස්කම් දක්වන ලද ක්‍රීඩකයින් කිහිපදෙනෙකු සිටිය බව දැක්විය යුතුය. මුදිත ප්‍රනාන්දු සමස්ථ තරගාවලිය තුළ ශතක දෙකක් රැස්කරමින් ලකුණු 374 ක්ද, සුලේක රණසිංහ අර්ධ ශතක 02 ක් සමග ලකුණු 264 ක් සහ කඩුළු 11 ක්ද, සඳරුවන් ප්‍රනාන්දු සහ දමිත් පෙරේරා අර්ධ ශතක 02 බැගින් වාර්තා කළ අතර පිළිවෙලින් ලකුණු 268 ක් සහ ලකුණු 178 බැගින් ලබා ගන්නා ලදී. පුහුණුකරු සහ ක්‍රීඩකයෙකු ලෙස තරගවැදුණු දිනූෂ ප්‍රනාන්දු ලකුණු 108 ක් සහ කඩුලු 18 ක් සහ ධනුෂ්ක සඳරුවන් ලකුණු 99 ක් ලබාගත් අතර කඩුළු 6 ක්ද බිඳ දැමීමට සමත් විය.

තවද පන්දු යවන්නන් ලෙස චාමර රත්නායක සමස්ත තරගාවලිය තුළ කඩුළු 13 ක්ද, සුරම්‍ය බණ්ඩාර කඩුළු 9 ක්ද, ජනිත් පෙරේරා කඩුළු 6 ක්ද ලබාගැනීමට සමත් විය.




අවසාන තරගයේදී තරගකාරී ඉනිමක් ක්‍රීඩා කළ සුලේක රණසිංහ එදින දෙපිළේම ක්‍රීඩකයින් සහ ප්‍රේක්ෂකයින් කුතුහලයට පත් කරමින් පන්දු 30 කදී ලකුණු 67 ක් රැස්කළ අතර ඊට 6 පහර 02 ක් සහ 4 පහර 10 ක් ඇතුළත් විය. කෙසේ වෙතත් අවසාන පන්දු වාරය වන විට ඒෂියා ඇසට් සමාගම ලබාගත් ලකුණු 188 ක ඉලක්කය හඹා යමින් සිටි **HNB** ග්‍රාමීන් කණ්ඩායමේ කඩුළු 9 ක් දැවී ගොස් තිබුණි. අවසාන පන්දු වාරයේදී ලකුණු 9 ක් ලබාගැනීමට තිබූ අතර කඩුල්ලේ රැඳී සිටියේ ධනුෂ්ක සඳරුවන් සහ සුරම්‍ය බණ්ඩාරයි. අවසාන පන්දු ඕවරය යැවීමට පැමිණියේ සමස්ථ තරගාවලියේ වැඩිම කඩුළු ප්‍රමාණයක් ලබාගෙන සිටි සහ හොඳම පන්දු යවන්නා බවට පත්වූ ක්‍රීඩකයායි. ධනුෂ්ක සඳරුවන් සැමගේ එකම බලාපොරොත්තුවයි. පළමු පන්දුව...ලෝන් ඕන් කලාපය හරහා ලකුණු 6...යි... ක්‍රීඩා පිටිය පුරා අප සමාගමේ ධජ ලෙලදෙයි. ප්‍රීති ඝෝෂා ඇසෙයි... තවත් ලකුණු 3 ක් අවශ්‍යයි. අවසාන කඩුල්ල...දෙවන පන්දුව, පන්දු යවන්නා දිව එයි. ධනුෂ්ක අවධානයෙන්...පොයින්ට් කලාපයෙන් ලකුණු 4යි...තරගය අවසානයි..**HNB ග්‍රාමීන් කණ්ඩාමට ජය...**




**තිළිණ දිසානායක**




**සාර්ථකත්වය යනු චාරිකාවකි එය නවාතැන් පොළක් නොවේ.**

# පහන් තරුව

## අම්මා

මා හඬනා විට කවි කියමින් මා
නැළවූ අම්මේ
සිරුරේ ලේ කිරි කර මට පෙව්වා
ඒ කිරි සුවඳින් අපි වැඩුනේ
අම්මේ ඔබගේ සෙනෙහසටයි....

අම්මගේ උකුලේ අප වැඩුණා
දෝතින් දෝතට මාරු වෙවී
ඒ ගුණ සිහි කර අප වැන්දේ
අම්මේ ඔබගේ සෙනෙහසටයි...

කඳුලැලි පිසදා දුක්ගිනි හංගා
සිටියා සිතතුළ මතකයි අම්මේ
ඒ කළ මෙහෙවර අගයමි අම්මේ
ඔබගේ දෙපතුළ වැඳවැටිලා...

දහසක් පැතුමන් සිතේ දරාගෙන
තම පුතු යැව්වා ලොවක් දිනන්නට
ඒ ලොව ජයගෙන එන්නෙමි අම්මේ
ඔබගේ මුව සිප සතුටු කරන්නට

- ජේ. උදාර කැලුම් ජයසුන්දර
පදවිය ශාඛාව

## ජීවිතය

දෑස් දල්වා
ඔරලෝසුව දෙස බලා සිටි
මා....
ඩිග් ඩිග් ඩිග් ඩිග්
හොඳට හුරු හඬක්
ඔරලෝසුවේ
තත්පර කටුවත් දුවනවා
ඒ වගේම මා...
හදවතද ගැහෙනවා
ඉක්බිතිව
නැවතුනා ඒ හඬ
ඒ නමුත්
තත්පර කටුව පෙරසේම
තවමත් එක දිගට
දුවනවා....

- අයි. එරන්ද පුෂ්ප කුමාර
වෙන්නප්පුව ශාඛාව

## සුළඟ

කවුළුව විවර කරන්න
සුළඟට ඔබේ වත,
සිප ගන්නට ඉඩ හරින්න
එවිට සැහැල්ලුවක්
දැනේවි
එහෙත්...
එයට ඔබව විනාශ
කරන්න
ඉඩ නොදෙන්න

එම්. ශෂිනි අනුෂ්කා ප්‍රනාන්දු
වෙන්නප්පුව ශාඛාව

## ගමේ විහාරය මනරම්

සුසැදි මනරම් කඳු වලල්ලෙන් වටවී සුදිලෙන සාර පිංකෙත
ලෙලෙන තුරුලිය වදුලු අතරින් ගලන නෑඹුල් දොළ කුමරි ගත
සිසිලසේ සිරි අසිරි විඳ විඳ අවට දිස්වන හරිත වන පෙත
අතර බිම් කඩ පුරාවට සැදි බුද්ධ මන්දිර නිවයි ගත සිත

අහස් ගැබයේ ගැටෙන ලෙස දිස්වෙනා චේතියේ කොත්
කැරැල්ලයි සීවලී සම්දුන්ගේ අභියස මෙත් දහම් ගඟ පිරි
ඉතිරෙයි වටවූ රන් වැට තුළින් දිස්වන අනඳ බෝහිමි රාජයයි
බොදු හැඟුම් මතු කරවනා අවුකන පිළිම ළඟ සිත්නිවී
සැනහෙයි

ශ්‍රී උතුම් වූ කේෂ ධාතුන් වැඩ හිඳින පිං බර විහාරය
ඒ කොන  මේ කොන සාදු නාදෙන් බුදු සමිදු නමදින මහා
විහාරය පුරයේ රයිගම් වැපුරූ පිංකෙත නායක  හිමි
කප්රුකක්මය සදා බැතියෙන් පුදා වදිනෙමි
මගේ ගම රෝෂිත විහාරය

- ඒ. චාලට් විජයසිරි
ඉංගිරිය






HNB ග්‍රාමීන් දඹුල්ල ශාඛාවේ සේවයේ
නියුතුව හිඳ අප අතරින් සමුගත්

**විහඟ සත්සර**

සොයුරා වෙනුවෙන්

සොඳුරු වූ යෞවනය ඉක්ම යන්නට පෙරම
නුඹ දිවිය කැපකලා
සොඳුරු වූ මෙහෙවරට...
ගම් දනවි පුරා නෙක ඇවිද ගිය
නුඹ ජවය මතක ඇති
**විහඟ** කැල අද පටන් ඇත සොවින...
මිතුරු කැල අතර වූ සිනහවේ
මතක පොද නිමාවුනි වැයෙද්දී...
දුක්බරම **සත්සරය**
පතන්නෙමු කෙළවරදී
නිවන් මග සැනසෙන්න...
අප සැමව තනිකරන්
දිවි මගේ නොසිතූ ලෙස...

සොවින් තැවෙන...
HNB ග්‍රාමීන් සමස්ථ සේවක මණ්ඩලය



# ආදායම් ප්‍රකාශය (Income Statement)

ව්‍යාපාරයක් සඳහා ණය මුදලක් නිකුත් කිරීමට පෙරාතුව අදාල ව්‍යාපාරිකයාගේ ව්‍යාපාරයේ ආදායම් වියදම් තත්වය පිරික්සීම සඳහා උපයෝගී කරගත හැක්කක් ලෙස ආදායම් ප්‍රකාශය වැදගත්වේ. කිසියම් නිශ්චිත කාල සීමාවක් තුළ අදාල ව්‍යාපාරය විසින් සිදුකරන ලද ආදායම් සහ වියදම් සැසඳීම තුළින් ඔහුගේ ව්‍යාපාරය ලැබූ ලාභය කොතෙක්ද පාඩුවක් වී නම් එය කොපමණ ප්‍රමාණයක් ද යන්න පිළිබඳව යම් අදහසක් මේ තුළින් ක්ෂුද්‍ර මූල්‍ය ණය භාර නිලධාරියාට ලබා ගත හැකිය. එය එසේ වුවත් මෙහි දී අප විසින් වටහාගත යුතු විශේෂ කරුණක් වේ. ආදායම් ප්‍රකාශය මඟින් මුදලින්ම සිදු වූ ආදායම් සහ වියදම් පෙන්නුම් නොකරන අතර එය තුළ ලැබීමට ඇති ආදායම් මෙන්ම ගෙවීමට ඇති වියදම් ද ඇත. එනම් එය පොත් අගයක් (Book Value) වේ. මේ නිසා ක්ෂුද්‍ර මූල්‍ය ණය නිකුත් කිරීම් පිළිබඳව සලකා බැලීමේ දී ආදායම් ප්‍රකාශය (Income statement) මත වැඩි විශ්වාසයක් තබා කටයුතු කිරීම නොකළ යුත්තකි. එහෙත් ඇතැම් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ආදායම් වාර්තා (Income statement) පිළිබඳව සැලකිලිමත් වන අවස්ථා ද නැත්තේ නොවේ. මේ තුළින් අවධානය යොමු කරන අංශ දෙකක් වෙයි.

## 1. ලාභය වත්කමක් ලෙස සැලකීම

තමා ණය දීමට අපේක්ෂා කරනු ලබන පුද්ගලයා විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයෙන් දැනට උපයන ලාභය කොපමණද. මේ තුළින් ඔහුට අනාගතයේ දී කොපමණ ලාභයක් ඉපැයීමට හැකියාවක් තිබේ ද? ඔහුගේ ව්‍යාපාරයට ණය මුදලක් ලබාදීම සඳහා සකසනු ලබන ශක්‍යතා වාර්තාවේ දී අදාල ණය භාර නිලධාරියා ඉහත කරුණු පිළිබඳව තොරතුරු ලබාගනුයේ ආදායම් වාර්තා පිරික්සීම තුළිනි.

## 2. ණය නැවත ගෙවීමේ හැකියාව විමසා බැලීම

ඇතැම් ව්‍යාපාරයන්හි ආදායම යම් තරමක ස්ථාවර තත්වයක පැවතිය ද තවත් ව්‍යාපාරයන්හි තත්වය එසේ නොවේ. නිදසුනක් ලෙස ගතහොත් සිල්ලර කඩ, ආපන ශාලා වැනි ව්‍යාපාරයන් හි මාසික ආදායම යම් ස්ථාවර තත්වයක පැවතියද ඇගලුම් නිෂ්පාදන, කිරි හරක් පාලනය ගොවිතැන් වැනි විශේෂ කාලයක් දැකිය හැකි ව්‍යාපාරයන්හි ආදායම මාසිකව එකම ස්ථාවරයක පවතිනු දැකිය නොහැකිය. එවන් ව්‍යාපාර සම්බන්ධයෙන් කෙටි කාලීනව ආදායම් වාර්තා පිරික්සීම කිරීමෙන් යම් සැබෑ නිගමනයකට එළැඹීමට පෙර ණය භාර නිලධාරියා විසින් අදාල ව්‍යාපාරිකයාගෙන් විමසා දැනගත යුතු ප්‍රශ්න කිහිපයක් වෙයි.

1. ව්‍යාපාරයේ ශුද්ධ ආදායම (Net Income) කොපමණ ද
2. එම ශුද්ධ ආදායම වසර පුරාම ඒකාකාරීව පවතින්නක්ද
3. පවුලේ සාමාජිකයන්ගේ ආදායම් සහ වියදම් තත්වය කෙබදුද
4. එදිනෙදා පරිපාලන වියදම් (විදුලිය ජලය ගෑස් ප්‍රවාහන වැනි) කොපමණ ද
5. මුදල් පොතක් (Cash book) යාවත්කාලීන කරමින් පවත්වාගෙන යන්නේ ද

මේ ප්‍රශ්න වලට ලැබෙන පිළිතුරු අනුව සහ ණය ඉල්ලුම් කරන පුද්ගලයාගේ බිරිඳ හෝ සැමියාගේ ආදායම් තත්වය ද විමසීමට ලක් කිරීම තුළින් අදාළ ණය ඉල්ලුම්කරු පිළිබඳ ශක්‍යතා වාර්තාවක් පිළියෙල කිරීමට ණය භාර නිලධාරියාට හැකි වේ.



HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරි චමින්ද ප්‍රභාත් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.



# ඩේල් කානගීගේ How to win Friends & influence people කෘතියේ සිංහල පරිවර්තනය

පුතුනි, අසන්න... ඔබ වැතිර නිදන අතරේ මම මෙය කියමි. ඔබේ පුංචි සුරත මිට මොළවාගෙන නිකට යටින් රැඳී තියේ. ඔබේ තෙත් වූ නළලතෙහි කෙස් ඇලී ගොසිනි. මම රහසේම ඔබේ කාමරයට ඇතුළු වූයෙමි. මොහොතකට පෙර මා සිටියේ මගේ පුස්තකාලයේ පුවත් පත කියවමිනි. එහෙත් දැඩි පසුතැවිල්ලකින් මසිත සසලව තිබුණි. එය සියුම් වැරදිකාර සිතුවිල්ලකි. ඔබ අද්දරට මා කැඳවූයේ ඒ පසුතැවෙන මගේ සිතයි. පුතුනි, මට සිතන්නට බොහෝ දේ ඉතිරිව තිබේ. මම ඔබට නිබඳවම හරස් වුණි. හිමිදිරියේ පාසල් යන්නට සැරසෙද්දී මම ඔබට දොස් කීවෙමි. ඒ ඔබ තෙත තුවායකින් යන්තම් මුහුණ පිස දා ගත් හෙයිනි.




ඔබ යළිත් මා ඉදිරියේ වරදකරුවකු වූයේ ඔබේ පාවහන් යුවළ අපවිත්‍රව තිබූ නිසාය. එපමණක් ද ගෙබිම පුරාම විවිධ දේ නොසැලකිලිමත්ව ඔබ විසි කර තිබෙනු දුටු විටදී ද මසිත පිරුණේ කෝපයෙනි. උදෑසන ආහාරය සඳහා අප මේසයේ හමුවෙද්දී ඔබේ වරදක් මට හසුවිය. මේසය පුරාම ඔබ කන්නට ගත් දේ හලා තිබුණි. ඒ මදිවාට ඔබ ආහාර ගත්තේ ද අවිනීතවය. පමණට වඩා ලොකු කොටසක් ඔබ කටේ ඔබාගත්තේ විශාල ආගාධයකට කුමක් හෝ දමන්නාක් මෙනි. ඔබ දෙවැලමිට මේසය මත තබා තිබුණි. පාන් වල බටර් ගෑවේද පමණට වඩා ගන තට්ටුවක් ලෙසිනි. ඔබ සෙල්ලම් කරන්නට පිටත්ව ගියේ මා සේවයට යන්නට දුම්රියට දුවද්දිය.

,ගුඩ්බායි ඩැඩී,

ඔබ මදෙස බලා අත වනා කීය. මම ඔබට රවා බැලීමි.

,පාරේ යද්දී උරහිස් කෙලින් තබාගෙන යන්න,

මම ඔබට පිළිතුරු ලෙසින් කීවෙමි. සැඳෑවේ යළි ගෙදර එද්දී ඔබ හිඳිනු මම ඈත තියාම දුටුවෙමි. ඔබ සිටියේ දණහිස බිම තබාගෙන පිල්බෝල ගසමිනි. ශීතලයට දමන ඔබේ මේස් යුවල දණහිස අද්දරින් ඉරී හිල් වී තිබුණි. ඒ ඔබ දණහිස බිම ගසා ගෙන සෙල්ලම් කිරීමෙනි. යළිත් මසිත කෝපයට පත් විය. ශිතලයට දමන දිගු මේස් මිල අධිකය. එහෙයින් මා ඔබට අණ කළේ මා ඉදිරියෙන් ආචාර පෙළපාලියක යන්නාක් මෙන් අපේ නිවස තෙක්ම යන ලෙසය. පුතුනි, ඔබේ මිතුරන් ඉදිරියේ මම ඔබට ලැජ්ජා කළෙමි. නමුත් මිල අධික දිගු මේස් ඔබේ මුදලින් ගන්නට සිදු වුයේ නම් ඔබ ඔයිට වඩා එය ප්‍රවේශම් කරනු ඇත. සිතන්න පුතුනි, මේ තාත්තා නිවැරදි නොවේ ද?

ඒ සිද්ධියෙන් පසු මා පුස්තකාලයෙහි සිටිය දී බොහෝ බියගුළුව ඔබ මා වෙතට ආවා ඔබට මතකද? ඔබේ ඇස් වල තිබුණේ බොහෝ ,සිත රිදුණු, ස්වභාවයකි. මම කියවමින් සිටි පුවත් පතට ඉහළින් ඔබ වෙත බැල්මක් හෙළීමි. මාගේ කියවීමට ඔබ බාධා කිරීමෙන් පොඩි අමනාපයක් ද මා සිත මතු වී තිබුණි. ඔබ කිසිවක් නොකියාම දෙගිඩියාවෙන් උළුවස්ස අද්දර සිටගෙන හිඳියේ ය.

ඕනෑමොනවද ඕනේ?, මම සැරයෙන් ඇසුවෙමි.

කිසිත් නොකියා ඔබ නිහඬය. උළුවස්සට හේත්තු වී හිඳි ඔබ එකවරම මා වෙතට දිව විත් මගේ කර වටා අතක් දමාගෙන මුහුණ සිප ගත්තේ ය. ඔබේ පුංචි දෑත් මගේ ගෙල වටා සිරවී තිබුණේ මහත් ආදරයෙනි. ඒ දෙවියන් වහන්සේ විසින් ඔබේ හදවතෙහි ඇති කළ සතුටය. ඔබ කළ වැරදි සියල්ලම ඒ සතුටින් අමතකව තිබුණි. එහෙත් කිසිත්ම නොදොඩා ඔබ මාහැර දමා තරප්පු පෙළ නැග නොපෙනී ගියේ ය. ඔබ මා සමඟ වදනක් හෝ නොදෙඩුවේ එයින් ද, මා කෝප වෙතැයි යන බියට විය යුතුය. පුතුනි, මුල් වරට අද දවසේ ඔබ ඉදිරියේ මා වරදකරුවෙකු වූවා යැයි මට සිතේ.

වාසනා ලියනආරච්චි

# HNB ග්‍රාමීන් දින පොත

## කඩුවෙල ශාඛාව දසවස සමරයි





HNB ග්‍රාමීන් කඩුවෙල ශාඛාව පසුගියදාට (2016.12.29) යෙදුණු සිය දසවෙනි සැමරුම නිමිත්තෙන් විශේෂ දානමය පුණ්‍යකර්මයක් සිදුකරනු ලැබුවා.ඒ කොරතොට වැඩිහිටි නිවාසයේ හතලිහක් පමණ වූ වැඩිහිටියන් උදෙසා දිවා ආහාරය සහ අතුරුපස පිළිගැන්වීමයි. මීට අමතරව මෙම වැඩිහිටියන් සඳහා ඇඳුම් පැළඳුම් සහ ත්‍යාග පිරිනැමීමද සිදු කරන ලදි. මෙම අවස්ථාවට HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් හි ප්‍රාදේශීය කළමනාකරු අසිත උඩුවැල්ල මහතා, ශාඛා කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලය සහභාගි වූහ.

## වත්තල ශාඛාව 14 වෙනි විය සපුරයි



HNB ග්‍රාමීන් සමාගමේ වත්තල ශාඛාව සිය 14 සංවත්සරය සමරමින් පසුගිය මාර්තු 28 වෙනිදින ප්‍රීතිපුර ළමා නිවාසයේ දූ දරුවන් සඳහා දිවා ආහාරය පිළිගැන්වීමක් සිදුකරන ලදි.මෙම සද්කාර්යයට සමගාමීව නේවාසික දරුවන්ගේ පරිහරණය සඳහා කබඩ් එකක් සහ සනීපාරක්ෂක උපකරණ ප්‍රදානයක්ද සිදුකරණ ලද අතර මෙම උදාර කටයුත්ත සඳහා HNB ග්‍රාමීන් සමාගමට අමතරව වත්තල ශාඛාවේ කාර්ය මණ්ඩලය සහ සාමාජික පිරිස්ද මූල්‍ය ආධාර ලබාදෙමින් දායකත්වය ලබාදුනි.











# ග්‍රාමීන් ශක්තියයි
# ඇගේ දිරියයි

පදවිය ශ්‍රී පුරට ගොස් වසන්ත මෝටර්ස් කියා විමසුවහොත් එය නොදන්නා කුඩා දරුවකු වුව සොයා ගැනීම අසීරුය. පලින් පල දැකිය හැකි කඩ කාමර කිහිපයක් හැරුණු විට එතරම්ම ජනාකීර්ණ ටවුමක් යැයි කිව නොහැකි පදවි ශ්‍රී පුර ටවුමට ආසන්නයේ පිහිටා ඇති වසන්ත මෝටර්ස් ව්‍යාපාරික ස්ථානය ප්‍රදේශයේ කාගෙත් විවිධ අවශ්‍යතා සපුරාලිය හැකි තැනකැයි සිතෙන්නේ එහි අභ්‍යන්තරය පිළිබඳව විමසිලිමත්ව බලන විටදීය. හාඩ්වෙයාර් අංගෝපාංගයන්ගේ සිට වාහන අමතර කොටස් දක්වා වූ සකල විධ දෑ ඒ තුළ අහුරා ඇත්තේ ප්‍රදේශයේ ජන ජීවිතයේ අවශ්‍යතා මනාව වටහා ගත්තෙකු තුළ ඇති ඉව අනුව යැයි මට සිතේ.

HNB ග්‍රාමීන් සමාගම සිය ව්‍යාපාරික ජීවිතයේ මූල්‍ය සහයකයා කර ගනිමින් වසර ගණනක් පුරා පියවරින් පියවර ඉවසීමෙන් හා බොහෝ බාධක කම්කටොළු වලට මුහුණ දෙමින් ආ ගමන පිළිබඳව මේ ව්‍යාපාරයේ හිමිකාරීත්වය උසුලන වසන්ත සහ නිලංගනී දෙන්නා දෙමහල්ලන්ට කියන්නට දිගු කතාවක් තිබේ. ඒ කතාව ඔවුන්ගේ හඬින් ඔබට අසන්නට ඉඩ දී මම නිහඬ වෙමි.

''මම ඉපදුනේ පදවි ශ්‍රී පුර කියන ගමේ. මගේ අම්මා තාත්තා දෙන්නම කළේ ගොවිතැන් කටයුතු. මගේ පවුලේ සහෝදරයන් පහයි. පුංචි කාලේ ඉඳලම මම හැදුනේ වැඩුනේ මගේ නැන්දා කෙනෙක් ළඟ. කුරුණෑගල සර් ජෝන් කොතලාවල විද්‍යාලයට මම ඉගෙනුම සඳහා ගියේ ඒ නැන්දගේ ගෙදර ඉඳන්. උසස් පෙළ දක්වා අධ්‍යාපන කටයුතු හදාරලා මම ආයිත් ගමට ආවා. ගමට ඇවිත් තාත්තලා අම්මලාට උදව් වෙන්න ඕන නිසාම මම රැකියා කිහිපයක්ම කළා. ඔය අතරේ දී තමයි මට මගේ මහත්තයා වසන්තව හම්බ වුනේ. ඊට පස්සේ ටික මහත්තයගෙන්ම අහගත්තොත් තමයි හොඳ. නිලංගනී පවසනුයේ සිනාසෙමිනි. මෙතෙක් කඩයට පැමිණි ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලමින් කඩිසරව හුන් වසන්ත අප අසලට පැමිණ සිය හඬ අවදි කළේ නිලංගනීගේ එම ඉල්ලීමට එකතු වෙමිනි.

මම ඉස්කෝලෙ යන කාලේ ඉඳලා ව්‍යාපාරවලට හුරුවක් තිබුණා. මොකද ඒ කාලේ අපේ බාප්පාට තිබුණා මෝටර් රථ අමතර කොටස් කඩයක්. මම ඒකෙ පොඩි කාලේ ඉඳලම වැඩ කළා. ඉන්පස්සෙ මම පුංචි 10 x 10 ප්‍රමාණයේ කඩ කාමරයක් හදාගෙන එතැන පිංතූර රාමු කරන ව්‍යාපාරයක් පටන් ගත්තා. ඔය අතරෙ තමයි 2003 දී මම විවාහ වුනේ. නිලංගනිත් එදා ඉඳලම මගේ ව්‍යාපාරයට උදව් කළා. අපි පිංතූර රාමු කරන අතරෙම කොළඹ ගිහින් මේ පළාතේ තියෙන ට්‍රැක්ටර් මෝටර් බයිසිකල්, ත්‍රී වීලර් වගේ ඒවාට උවමනාවෙන මෝටර් රථ අමතර කොටස් උපාංග ගෙනැල්ලා මෙතැනම පැත්තක තියන් ඒවාත් විකුණුවා. එකකට එකක් නොගැළපෙන ව්‍යාපාර වුණත් පුංචි කාලේ ඉඳලා ඇගේ තිබුණ දේ නිසා වෙන්න ඇති මෝටර් රථ අමතර කොටස් පැත්තට හිත යොමු වුනේ.

මෝටර් රථ අමතර කොටස් මිළදී ගැනීම සඳහා අපි එකපාර සල්ලි ගෙවන්න ඕන. මේ නිසා අපිට මුදල් අවශ්‍යතාවය හරියට දැනුනා. පුංචි කඩ කාමරයක අපිළිවෙලට කරන මේ ව්‍යාපාරයට ණය දෙන්න බැංකු කැමති වුනේ නෑ. ඔය අතරෙ තමයි අපිට ග්‍රාමීන් සමාගම ගැන දැනගන්න ලැබුණේ. ඒකෙන් කිසිම ඇපයක් නැතිව පුංචි ව්‍යාපාරිකයන්ට ණය දෙනවා කියලා දැන ගන්න ලැබුණාම ඇත්තටම මගේ ඉහේ මලක් පිපුණා වගේ දැනුණා. ඒ අනුව නිලංගනී ග්‍රාමීන් සමාගමේ සාමාජිකාවක් වුණා 2007 අවුරුද්දෙදී. රු. 20000, රු. 40000, රු. 60000 වගේ ණය මුදල් පියවරෙන් පියවර වැඩිකර ගනිමින් අපේ ව්‍යාපාරය සඳහා ඒ මුදල් ආයෝජනය කළා. ඉන් පස්සේ එතෙක් අපිට මුහුණ පාන්නට සිද්ධ වුණු මුදල් ප්‍රශ්නවලට විසඳුමක් ලැබුණා. අපිට තිබුණේ ගත්ත ණය මුදල නිවැරදිව කළමනාකරණය කර ගනිමින් ව්‍යාපාරය ඉදිරියට ගෙනයාමයි. අපි රෑ දවල් නැතිව මහන්සි වුණා. බස් එකේ මහ පාන්දර කොළඹ ගිහින් ව්‍යාපාරයට ඕන කරන බඩු ඒ බස් වල පටවාගෙන මහ රෑ වෙලා මම ගෙදර එනවා. බස්වල කොන්දොස්තරලාගෙන් බැනුම් අහපු..., වෙළෙන්දන්ට රැවටුණු වාර ඕන තරම්. ඒ සේරම ජීවිතේ අත්දැකීම්. මම පොටෝ රාමු කිරීම නවත්තලා මුළු ව්‍යාපාරයම හාඩ්වෙයාර් බඩු සහ මේ ප්‍රදේශයට අවශ්‍ය මෝටර් රථ උපාංග අලෙවි කිරීම සඳහා වෙන් කළා. අපේ පුංචි කඩ කාමරේ සල්ලි තියෙන තියෙන විදිහට කෑල්ල කෑල්ල එකතු කරල ලොකු කළා. අද මෙහෙම ලොකුවට තිබුණාට මේ කඩේ තිබුණු විදිහ වගේම ඒක මේ අවුරුදු ගාණ පුරා ළමයෙක් වගේ හැදී වැඩෙන හැටි ග්‍රාමීන් එකේ සර්ලා දැක්කා. වසන්ත පවසනුයේ අප සමඟ සිටි පදවිය ශාඛාවේ සහකාර කළමනාකරු සම්පත් විජේසිංහ මහතා දෙස බලමිනි. ඒ දෑස් පුරා රැඳී ඇත්තේ කෘතවේදීත්වයේ මතක සටහන්ය. මම සම්පත් දෙස බලමි. ඔහු මුව රැඳී ඇත්තේ සිනහවකි. වෙනත් කිසිදු වෘත්තීයක නියැලෙන්නෙකුට ආශ්වාදය කළ නොහැකි තෘප්තිමත් බවක් සහ ජයග්‍රාහී බවක් ඒ සිනහව තුළ ඇඳී ඇතැයි මට සිතේ. මිනිසෙකු සාර්ථකත්වය කරා ගමන් කිරීම සේම ඒ සාර්ථකත්වය කරා ගමන් කිරීමට අවැසි පසුබිම සහ ආධාර උපකාර කිරීමද ජීවිතය පුරා යළි යළි සිතමින් ආශ්වාදය කළ හැකි මතක සැමරුම්ය. ඒ සතුට වසන්තට නිලංගනීට සේම HNB ග්‍රාමීන්හි අප සැමටද උරුමය.■




## මම මේ ව්‍යාපාරය මේ තත්වෙට ගේන්න දාපු දහිරිය ග්‍රාමීන් එකේ සර්ලා දන්නවා...

සටහන
මංජුල හෙට්ටිආරච්චි
- ඡායාරූප -
ලක්ෂ්මන් කුමාරතුංග

අල්ලක් පමණ වු අප හදවත තුළට කොපමණ සිතුවිලි රඳවාගත හැකිද?

# මේ කඩපිලේ ඉන්න හුඟදෙනෙක් ව්‍යාපාරය සඳහා අවශ්‍ය ණය මුදල් ගන්නේ HNB ග්‍රාමීන් සමාගමෙන්.

හම්බන්තොට කිව්වාම කළුදොදොල් මස්කට් වගේ රසකැවිලි වලට තියෙන්නේ ඉහළම ප්‍රසිද්ධියක්. කොළඹ කතරගම මාර්ගයේ හම්බන්තොට ටවුන් එකට යාබදව තියෙන දොදොල් කඩ පේළිය නොදන්න කෙනෙක් නැති තරම්. ඉන්දු කළුදොදොල් කඩේට අපි ගොඩවුණේ කළුදොදොල් කන්න නෙවෙයි. එහි හිමිකාරිය වූ ඉදුනිල් ප්‍රියංගිකා මහත්මිය හා ග්‍රාමීන් සමාගම අතර බැදුණු පාරිභෝගික සබඳතාව පිළිබඳව විමසන්නයි.

අපි පරම්පරාවෙන්ම මේ ව්‍යාපාරයේ යෙදෙන අය. HNB ග්‍රාමීන් සමාගම තමයි එදා ඉඳන්ම අපේ ව්‍යාපාරයට අතහිත දුන්නේ. මේ කඩපලේ ඉන්න හුඟදෙනෙක් ව්‍යාපාරය සඳහා අවශ්‍ය ණය මුදල් ගන්නේ ඍහර් ග්‍රාමීන් සමාගමෙන්. හේතුව, අපි කාටත් ග්‍රාමීන් සමාගම එක්ක තියෙන්නේ විශ්වාසනීය බැඳීමක්. කඩේට ඕන සෙල්ලම් බඩු වර්ග ගන්න මගේ මැහුම් ව්‍යාපාරය සඳහා අවශ්‍ය රෙදිපිළි ගන්න වගේ මේ හැම දෙයක්ම සඳහා මම ග්‍රාමීන් සමාගමෙන් අවස්ථා ගණනාවකදී ණය මුදල් අරන් තියෙනවා.

ඉදුනිල් ප්‍රියංගිකා - ඉන්දු කළුදොදොල්, හම්බන්තොට




## ගනුදෙනුවකට එහා ගිය සේවාවක් ග්‍රාමීන් සමාගමෙන් ලැබෙනවා...



මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුණේ අවුරුදු දහයකට දොළහකට කලින් ඉදලයි. මගේ නැන්දම්මා මුලින් අම්බලන්තොට පොළේ වෙළෙඳාම් කළා. ඉන්පස්සේ මමත් පොළේ වෙළෙඳාමට එකතු වුණා. පොළට අමතරව මගේ තවත් ස්ථිර කඩලෑලි දෙකක් තියෙනවා. පොළ නැති දවස් වලට එතැන වෙළඳාම් කරනවා. ඒ කාලේ ඉඳන්ම මම ගනුදෙනු කරන්නේ ග්‍රාමීන් සමාගම එක්ක. ඒකේ සර්ලාගේ තියෙන හිතවත්කම ගනුදෙනුවකට එහා ගිය සේවාව තවත් මූල්‍ය ආයතනයකට යන්න අපිට තියෙන ඉඩ වළක්වනවා. ඒ ගන්න ණය අඩුවක් නැතිව නැවත ආපසු ගෙවන්න අපිව පොළඹවන්නෙත් අපි ණයක් ගත්තා කියන හැඟීමට වඩා උදව්වක් ගත්තා කියන හැඟීම හිත තුළ ඇති කළ නිසයි.

J. B. පියසීලි - අම්බලන්තොට කෝට්ටේගෙදර

## ජංගම ගිණුම් හිමි සාමාන්‍ය ව්‍යාපාරිකයින්ට මේ ණය ක්‍රමය ඉතා වැදගත්.

ව්‍යාපාර ගණනාවකටම අතගසා සිටින තරුණ ව්‍යාපාරිකයකු ලෙස ඉසුරු ප්‍රනාන්දු ප්‍රදේශයේ කා අතරත් හොඳ නමක් දිනා සිටින ව්‍යාපාරිකයෙකි.හෝටල් ව්‍යාපාරයක් සර්විස් සෙන්ටර් එකක් ආදී වශයෙන් ව්‍යාපාර කිහිපයක සාර්ථක ව්‍යාපාරිකයකු ලෙස කටයුතු කරන ඉසුරු මීට මාස කිහිපයකට පෙර අළුතින්ම ඇරඹූ ව්‍යාපාරය වූයේ "අඹ සෙවන ෆිට්නස් සෙන්ටර්" නමින් වූ ව්‍යාපාරයයි. ඔහුගේ නවතම ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවැසි මූලික මුදල සොයා ගැනීම සඳහා ඔහු පියමැන්නේ HNB ග්‍රාමීන් ෆිනෑන්ස් වෙතය.

"මමත් කාලයක් ඉඳලා ව්‍යායාමවල නිරතව උන්නු කෙනෙක් ඒ නිසාම ෆිට්නස් සෙන්ටර් එකක් පටන් ගත්තොත් ඒක මේ ප්‍රදේශයේ තරුණයන්ට ලොකු අවස්ථාවක් වෙයි කියලා මම හිතුවා. මොකද මම මේ ව්‍යාපාර පටන් ගන්න කොට වෙනත් ෆිට්නස් සෙන්ටර් එකක්වත් මේ ප්‍රදේශයේ තිබුණෙ නෑ. මේ සඳහා ණය මුදලක් ඉල්ලුම් කිරීමට මූල්‍ය ආයතනයක් පිළිබඳව විමසිලිමත් වෙද්දි තමයි මට HNB ග්‍රාමීන් Eazy Loan ගැන දැන ගන්න ලැබුණෙ. වෙනත් මූල්‍ය ආයතන සහ ණය ක්‍රම ගැන හිතද්දි ග්‍රාමීන් සමාගම හඳුන්වාදෙන Eazy Loan ණය මුදල අඩු කාලයකින් වගේම ඉතා පහසුවෙන් ලබාගත හැකි නිසා මම ලක්ෂ පහළොවක ණය මුදලක් ග්‍රාමීන් සමාගමෙන් ලබා ගත්තා. විශේෂයෙන් ජංගම ගිණුම් හිමි සාමාන්‍ය ව්‍යාපාරිකයින්ට මේ ණය ක්‍රමය ඉතා වැදගත්. මුලින් ගත්ත ණය මුදල ගෙවා නිමකිරීමෙන් පස්සේ තව ණය මුදලක් අරන් මේ ව්‍යාපාරය තවත් පුළුල්කර සාර්ථකව පවත්වාගෙන යාමයි මගේ බලාපොරොත්තුව.

එච්.එච්.ඒ.ඉසුරු ප්‍රනාන්දු, අඹ සෙවන ෆිට්නස් සෙන්ටර්, හොරොව්පතාන පාර, කැබිතිගොල්ලෑව.



## අභිලාෂ ණය ක්‍රමය කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් වෙනුවෙන්ම සැලසුම් කළ ණය ක්‍රමයක්.



පදවි ශ්‍රී පුර අභය පුර මාර්ගයට ආසන්නව ආනන්ද ගුණතිලක මහතාගේ නිවස පිහිටා තිබේ. දොර ජනෙල් මේස කබඩ් වැනි ගෘහ භාණ්ඩ පමණක් නොව ලී ආශ්‍රිත ඕනෑම විසිතුරු නිර්මාණයන්ද කිරීමේ සහජ දක්ෂතාවන්ගෙන් පිරිපුන් ආනන්ද මහතාගේ වඩු මඩුව එම ප්‍රදේශයේ පමණක් නොව අහල ගම් හතේම ප්‍රසිද්ධියක් උසුලන වැඩ බිමක් බව බොහෝ සකසුරුවමට කළ ඔහුගේ නිර්මාණ දෙස බලන්නෙකුට වටහා ගැනීම අසීරු නැත.

"මම මේ ව්‍යාපාරය පටන් අරන් අවුරුදු දහයක් විතර ඇති. මේ කර්මාන්තෙ මම කාගෙන්වත් ඉගෙන ගෙන කරන්න පටන් ගත්තු දෙයක් නෙවෙයි. සහජ හැකියාවයි වැඩ කිරීමෙන්ම ලද පුහුණුවයි තමයි මට තියෙන්නේ. හදන බඩු භාණ්ඩ හැම එකක්ම එකිනෙකට වෙනස්ව මමම හිතලා කරන මෝස්තර වලට අනුව තමයි කරන්නේ. ව්‍යාපාරය සඳහා අවශ්‍ය උපකරණ සහ අමුද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා යම් ණය මුදලක් අවශ්‍යව තිබුණු අවස්ථාවක මට HNB ග්‍රාමීන් සමාගම ගැන දැන ගන්න ලැබුණා. එහි අභිලාෂ ණය ක්‍රමය අපි වගේ සාමාන්‍ය කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් වෙනුවෙන්ම සැලසුම් කළ ණය ක්‍රමයක්. ණය මුදල ලබා ගන්න රස්තියාදු වෙන්න ඕන වුණේ නෑ වගේම ඒ ණය මුදල ගෙවන්නත් මට ග්‍රාමීන් එකට යන්න ඕන වෙන්නෙ නෑ. මොකද ග්‍රාමීන් එකේ මහත්තුරු මගේ ගෙදරටම ඇවිල්ලා අදාල ණය වාරික ලබා ගන්නවා.ඒකෙන් මගේ දවසේ වැඩ කටයුතු කිසිදු රස්තියාදුවකින් තොරව කලට වේලාවට කිරීමේ හැකියාව මට ලැබී තියෙනවා.අභිලාෂ ණය ක්‍රමයෙන් මම මුලින්ම ලක්ෂ එකහමාරක් අරන් ඉන් පස්සෙ ඒක ගෙවලා ඊළඟට තව ලක්ෂ තුනක් ගත්තා.මගේ පුතත් ඉතා දක්ෂ ලී කැටයම් නිර්මාණ ශිල්පියෙක්. ඔහුගේ වැඩ කටයුතු වලටත් ග්‍රාමීන් ණය මුදල් ලොකු පිටුවහලක් වුණා.



ඩී.පී. ආනන්ද ගුණතිලක, අභය පුර, පදවි ශ්‍රී පුර

තමා නිවැරදි විට අනුන් කෙතරම් දොස් නැගුවත් එයට කමක් නැත.




# යුද්ධයෙන් හා දුප්පත්කමින් බැටකෑ මිනිසුන්ට අපේ සේවාවන් ලබා දුන්නා.... HNB ග්‍රාමීන් පදවිය ශාඛාව

කෘෂි කර්මාන්තය ජීවනෝපාය කරගත් පිරිස් වැඩි වශයෙන් ජීවත් වන තවත් එක් ප්‍රදේශයක් ලෙස පදවියට හිමි වනුයේ වෙසෙස් තැනකි. ග්‍රාමීන් සමාගම ආරම්භක අවධියේ දී කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලි පිරිස් වෙත ණය ලබාදීම අරමුණු කර ගනිමින්ම පදවියේ ග්‍රාමීන් කෘෂි කාර්මික ණය සමාගමේ ශාඛාවක් ආරම්භ කරන ලදී. ඒ 2005 වසරේදීය. එදා මෙදාතුර ගෙවී ගිය කාලය තුළ කාලය හා සමාජය බොහෝ වෙනස්කම් වලට ලක් විය. ග්‍රාමීන් සමාගමද එවන් විපර්යාසයන් වලට ලක්වෙමින් වැඩි වර්ධනය වූයේ එහි ග්‍රාමීන් නමේ මුලට **HNB** යන දැවැන්ත නාමයේ ශක්තිය ද එක්කාසු කරමින්ය.

**HNB** ග්‍රාමීන්හි ශාඛා ලැයිස්තු කිරීමට අනුව 48 වන ශාඛාව වන්නේ පදවිය ශාඛාවය. මෙහෙවර මෙවර කළාපයෙන් දිගහැරෙන්නේ පදවිය ශාඛාවේ වගතුගය. පදවිය ශාඛාව ආරම්භයේ සිටම එහි නිළධාරියකු ලෙස සේවය කළ වත්මන් පදවිය ශාඛාවේ ශාඛා කළමනාකරු අසංක විජේසිංහ මහතා සිය ශාඛාවේ වගතුග අප හමුවේ පෙළගැස්වීමට මුල පිරුවේ මෙලෙසිනි.

2005 වසරේ කෘෂිකාර්මික ණය සමාගමක් විදිහට පදවිය ශාඛාව ආරම්භ කළේ උෂා නිවස පරාක්‍රමපුර කියන ලිපිනයේ. ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක් විදිහට 2009 අවුරුද්දේ ඉඳන් සුළු ව්‍යාපාර සඳහා අපි ණය නිකුත් කරන්න පටන් ගත්තා. අපි දැන් ඉන්න තැනට එනම් බණ්ඩාරනායක හන්දිය පදවිය කියන


පදවිය ශාඛාවේ කාර්ය මණ්ඩලය

ලිපිනයට ශාඛාව ගෙනාවේ 2013 වසරේ අවසානයේ දීය.

පදවිය කියන්නේ කෘෂි කර්මාන්තය මූලික කරගත් ජීවනෝපායන්ගෙන් එදා වේල හරි හම්බ කර ගන්න මිනිස්සු ඉන්න ප්‍රදේශයක්. කුඹුරු ගොවිතැන් වගේම එළවලු වගාව හේන් ගොවිතැන් වගේම මිරිදිය ධීවර කර්මාන්තයෙන් දිවි ගෙවන පුද්ගලයන් තමයි මේ ප්‍රදේශයේ වැඩිපුර ජීවත් වෙන්නේ. ඊට අමතරව ගඩොල් කර්මාන්තය, සිල්ලර කඩ, ඇඳුම් මැසීම වගේ ව්‍යාපාර තම ජීවනෝපාය කරගත් සුළු පිරිසකුත් යම් තරමකට ඉන්නවා.

අප විසින් මෙහෙයවනු ලබන මධ්‍යස්ථානය පදවියේ ඉඳන් වැලිඔය පුල්මුඩේ, කැබිතිගොල්ලෑව, ශ්‍රී පුර යන ප්‍රදේශ දක්වා විහිදී යනවා. එතැනින් එහා කොටස නැදුන්කර්නි. අපේ සේවා මධ්‍යස්ථානය මඟින් ආවරණය කරනු ලබනවා. විශේෂයෙන් ද්‍රවිඩ ජනතාව බහුල වශයෙන් ජීවත් වන නැදුන්කර්නි හි **HNB** ග්‍රාමීන් සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කරන්නේ 2014 අවුරුද්දේ. නැදුන්කර්නි සේවා මධ්‍යස්ථානය මඟින් ඔඩ්ඩුසුඩාන්, මාන්කුලම්, පුලියන්කුලම් යන ප්‍රදේශ ආවරණය කරනු ලබනවා.

2005 දී අපි පදවිය ශාඛාව ආරම්භ කරද්දී මෙහි වෙනත් කිසිදු මූල්‍ය ආයතනයක් තිබුණේ නෑ. යුද්ධයෙන් හා දුප්පත්කමින් බැටකෑ අසරණ මිනිසුන් කොටසකට අපි අපේ සේවාවන් ලබා දුන්නා.ඒත් අද වෙද්දී වෙනත් ප්‍රධාන මූල්‍ය ආයතන 8 ක් විතර මේ පළාතේ පිහිටුවා තියෙනවා. ඔවුන් සමඟ අපිට තරගයක් නෑ. මොකද වසර ගණනක් පුරා රැකගත් මිත්‍රශීලී බවක් හිතවත් කමක් අප හා ඔවුන් අතර ගොඩනැගී තියෙනවා.

12 පිටුවට

| | කාර්ය මණ්ඩලය | සාමාජික සංඛ්‍යාව | මධ්‍යස්ථාන සංඛ්‍යාව |
|---|---|---|---|
| පදවිය ශාඛාව | 17 | 2320 | 102 |
| නැදුන්කර්නි සේවා මධ්‍යස්ථානය | 8 | 1536 | 76 |


කාංචන බෙලිකුඹුර
ප්‍රාදේශිය කළමනාකරු


රනිල් ප්‍රසාද් - කළමනාකරු
මූල්‍ය සහ අනුකූලතා


අසංක විජේසිංහ
ශාඛා කළමනාකරු


සම්පත් විජේසිංහ
සහකාර ශාඛා කළමනාකරු


චන්දන සමන්
ජ්‍යෙෂ්ඨ විධායක
(මූල්‍ය සහ පරිපාලන)


අනුරුද්ධික තිලක්
කණිෂ්ඨ සහකාර කළමනාකරු
(ක්ෂුද්‍ර මූල්‍ය)

**ජීවත් වීමට හුස්ම ගැනීම අවශ්‍ය වේ. එසේම ආදරය නැති විට ජීවත් වීමද මියයෑම වැනිය.**

# "මෙහෙවර" සත්කාර අරමුදලින් පිළිසරණ ලැබූවෝ...

මිනිසුන් අසරණ වන්නේ කොයි මොහොතක කෙසේදැයි අප කාහට නම් කිව හැකිද...එවන් මොහොතක ඒ අසරණ මිනිසුන්හට කිසියම් හෝ අන්දමකින් සරණ විය හැකිනම්....මෙහෙවර සත්කාර අරමුදල බිහිවන්නේ එවන් උදාර අරමුණක් පෙරදැරිවය.

HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබගේම ධන පරිත්‍යාගයෙන් ගොඩනැගුණු "මෙහෙවර" සත්කාර අරමුදලේ පිහිට පතමින් දිවයිනේ දසතින් අපවෙත ලැබෙන ඉල්ලීම් සිය ගණනක් අතරින් තෝරාගත් පිළිසරණ අපේක්ෂකයින්හට පසුගිය 2017 ජනවාරි පෙබරවාරි මාසයන්හිදී අට ලක්ෂ හැටඅට දහසක ආධාර මුදල් පිරිනැමීමට අපි කටයුතු කළෙමු. එසේ මේ වනවිටත් ආධාර ලබාදී ඇති ආධාර ලාභීන් කිහිප දෙනකු පිළිබඳ තොරතුරු මෙසේය.



**01. අම්බලන්ගොඩ ශාඛාව**
සාමාජිකාවඃ- පී.ආර්. චතුරානි
ආධාරලාභියාඃ- පී.ආර්. චතුරානි (සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුවඃ- ගිනි ගත් නිවස පිළිසකර කරගැනීම සඳහා



**02. නිකවැරටිය ශාඛාව**
සාමාජිකාවඃ- එච්.ජී.සෝමවතී
ආධාර ලාභියාඃ- ආර්.පී.එම් පිලිසාමි(සැමියා)
ආධාර ලබාදීමට හේතුවඃ- හදිසි අනතුරකට ලක්වීම නිසා ඖෂධ සඳහා



**03. මහියංගනය ශාඛාව**
සාමාජිකාවඃ- ජේ.ලලනි
ආධාර ලාභියාඃ- එම්.ආර්.රත්නායක (සැමියා)
ආධාර ලබාදීමට හේතුවඃ- ඖෂධ සඳහා



**04. පුත්තලම ශාඛාව**
සාමාජිකාවඃ- බී. උසාන්දනී
ආධාර ලාභියාඃ- බී. උසාන්දනී ( සාමාජිකාව )
ආධාර ලබාදීමට හේතුවඃ- ගිනි ගත් නිවස පිළිසකර කරගැනීම සඳහා

**05. අවිස්සාවේල්ල ශාඛාව**
සාමාජිකාවඃ- ඩබ්.එම්.ඩී ඉරෝෂණී
ආධාර ලාභියාඃ- ආර්.පී.ජී. තිලකරත්න (පුතා)
ආධාර ලබාදීමට හේතුවඃ- ඖෂධ සඳහා



**06. මහියංගනය ශාඛාව**
සාමාජිකාවඃ- එස්.එම්.වී.පී විජේකෝන්
ආධාර ලාභියාඃ- එස්.එම්.වී.පී විජේකෝන් ( සාමාජිකාව )
ආධාර ලබාදීමට හේතුවඃ- ඖෂධ සඳහා

HNB ග්‍රාමීන් සමාගම තම කාර්ය මණ්ඩලයේ සහ ගනුදෙනුකාර භවතුන්ගේ අභිවෘද්ධිය සහ ශක්‍යතාවන් ඉහළ තලයක් කරා ඔසවා තැබීමට නිරතුරුව වෙහෙසෙන සමාගමකි.මෙම අරමුණ ඇතිව ස්ථාපිත කර ඇති පුහුණු අංශය මගින් මෙම වසරේ පසුගිය මාස කිහිපය තුළ සංවිධානය කර මෙහෙයවන ලද වැඩමුළු ගණනාවක් අතරින් පහත සඳහන් වැඩමුළු පිළිබඳ තොරතුරු අපවෙත ලැබී තිබුණා.



HNB ග්‍රාමීන් බදුල්ල ශාඛාවේ නිලධාරීන්ගේ දැනුම ආකල්ප ඔප්නංවනු සඳහා පුහුණු අංශය මගින් 25.02.2017 දින පවත්වන ලද සේවක අභිප්‍රේරණ වැඩසටහන.



මාතර ශාඛාවේ මධ්‍යස්ථාන නායිකාවන්ගේ මූල්‍ය කළමනාකරණය සම්බන්ධ දැනුම වැඩිදියුණු කිරීම සඳහා 24.02.2017 දින පවත්වන ලද මූල්‍ය සාක්ෂරතා වැඩසටහන. පුහුණු අංශ ප්‍රධානි අනුර උඩවත්ත මහතා විසින් මෙම වැඩසටහන් මෙහෙයවන ලදි.



වව්නියා ශාඛාවේ නිලධාරීන්ගේ දැනුම ආකල්ප ඔප්නංවනු සඳහා 18.02.2017 දින පුහුණු අංශය මගින් පවත්වන ලද මෙම පුහුණු වැඩසටහන තිලීබන් රවීන්ද්‍රන් විසින් මෙහෙයවීය.

## නාය යාමෙන් අවතැන් වූ පවුල් වෙත ග්‍රාමීන් පිළිසරණ

වැලිමඩ ශාඛාවට අයත් හපුතලේ ග්ලැනෝර් වත්ත, ප්‍රදේශයේ පැවැති තද වැසි හේතුවෙන් නිවාස විශාල ප්‍රමාණයක් නාය යාමට හසුවූ අතර ප්‍රදේශයේ ජීවත්වූ පවුල් 50 පමණ අවතැන් විය. මේ අවස්ථාවේදී කඩිනමින් ක්‍රියාත්මක වූ HNB ග්‍රාමීන් වැලිමඩ ශාඛාවේ කාර්ය මණ්ඩලය විසින් ප්‍රධාන කාර්යාලයේ උපදෙස් මත එසේ අවතැන් වූ පවුල් අතර සිටි HNB ග්‍රාමීන් සාමාජික පවුල් 22 වෙත වියළි ආහාර සලාක බෙදාදෙන ලදී. මේ අවස්ථාවට HNB ග්‍රාමීන් හි වැලිමඩ ශාඛාවේ කළමනාකරු රෝහන අබේසේකර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිළධාරීහු එක්වූහ.









ඔබයම් නිවසකට ගොඩවනවිට පාවහන් ගලවා යන්නේනම් නිවැසියාට කරන ගරුකිරීමකි.

# HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලය OBT යයි

සිය කාර්ය මණ්ඩලයේ නිර්මාණශීලී නායකත්ව ගුණාංග වර්ධනය කරලීමත් කණ්ඩායම් හැඟීම වර්ධනය කරලීමත් අරමුණු කරගනිමින් විවිධ පුහුණු වැඩසටහන් සහ අවස්ථා ලබාදීමට HNB ග්‍රාමීන් සමාගම නිරතුරුව උනන්දු වෙයි.මෙම වැඩපිළිවෙලේ 2017 වසරේ පළමු නායකත්ව පුහුණු වැඩසටහන පසුගිය අප්‍රේල් 29-30 දෙදින තුළ අවිස්සාවේල්ල "වේ ඇඩ්වෙන්චර් බේස් කෑම්ප්" හිදී HNB ග්‍රාමීන් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහ ඉහළ කළමනාකාරිත්වයේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබීය. විවිධ ශාරීරික සහ මානසික ක්‍රියාකාරකම් මගින් ශාරීරික මානසික සුවතාව වර්ධනය කරලීමට අවශ්‍ය ක්‍රියාකාරකම් රැසක නිරතවීමට මෙහිදී අප කණ්ඩායමට අවස්ථාව ලැබුණු බව මෙම වැඩසටහන සංවිධානය කළ HNB ග්‍රාමීන් පුහුණු අංශ ප්‍රධානි අනුර උඩවත්ත මහතා මෙහෙවරට පැවසීය.









# සුබ මංගලම්



එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි රත්නපුර ප්‍රාදේශිකයේ ප්‍රාදේශීය කළමනාකරු වූ චාමර රත්නායක මහතා පසුගිය අප්‍රේල් 24දා නව යුගදිවි ගමන් ඇරඹීය . ඔහුගේ අතගත් මනාලිය වූයේ ලක්ෂිකා දේශානී මෙනෙවියය. එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු කාර්ය මණ්ඩලයේ උණුසුම් සුබ ප්‍රාර්ථනා චාමර - ලක්ෂිකා යුවල වෙත මෙසේ පිළිගන්වමු...

## HNB ග්‍රාමීන් සේවක මණ්ඩලයේ අනුග්‍රහයෙන් මඤ්ඤොක්කා දන්සැලක්




HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ සහ නගර ශාඛාවේ සේවක මණ්ඩලය මඟින් සිව්වන වරටත් සංවිධානය කරන ලද මහා මඤ්ඤොක්කා දන්සැල මැයි මස 12 වෙනි දින සවස 4.00 සිට රාත්‍රිය වෙනතුරු HNB ග්‍රාමීන් ප්‍රධාන කාර්යාලය ඉදිරිපිටදී සුවිශාල ජනකායකගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

# ජය මඟක සළකුණු

# වැඩිම යාළු ඉතුරුම් ප්‍රමාණයක් ලබා ඉලක්කය ජය ගත් හැටි ගැන ඔවුන් කියන කතා

**වෘත්තිය ජීවිතය තුළ තමන්ට ලැබෙන වගකීම් ඉටුකරන අතරම ආයතනය විසින් ලබාදෙන අනෙකුත් වගකීම්ද තමන්ට ලැබුණු අවස්ථාවක් කරගනිමින් ඒ වෙනුවෙන් කැප වෙන්නෝ අපට ඉදහිට හෝ හමුවන්නේය. HNB ග්‍රාමින්හි සේවයේ නියුතු සුවහසක් අප සහෝදර සේවක මණ්ඩලයේ සේවයේ නියුතු එවන් වගකීම් ඉසිලිය හැකි සහෝදර සහෝදරියන් අතරින් මේ මිතුරන් තිදෙනා අපට හමුවන්නේ නිකවැරටිය ශාඛාවෙනි. පසුගිය මූල්‍ය වර්ෂයේ යාළු ඉතුරුම් සම්බන්ධයෙන් ආයතනය මගින් ලබාදුන් ඉතුරුම් ඉලක්ක සපුරාලමින් මුළු දිවයිනෙන්ම වැඩිම ඉතුරුම් ඉලක්කයක් සපුරාලීමට මේ සුමිතුරෝ සමත් වූහ.මේ ඔවුන්ගේ ජයග්‍රාහී ගමනේ කතාව අප හා පැවසූ අයුරුයි.**




අජිත් කුමාර
සහකාර කළමනාකරු

ආර්.සුදර්ශන්
ජ්‍යෙෂ්ඨ විධායක
(ගිණුම් සහ පරිපාලන)

12 පිටුවෙන්

විශේෂයෙන් අපි ජනතාව සමීපයට ගොස් අපගේ සේවාවන් ලබාදීමත් අපේ සාමාජිකාවන් සඳහා ලබාදෙන විශේෂ පුහුණු වැඩසටහන් සහ ව්‍යාවසායකත්ව උපදේශන වැඩමුළු නිසාත් ඔවුන් තුළ **HNB** ග්‍රාමීන් ෆිනෑන්ස් පිළිබඳව තියෙන්නේ කෘතවේදී හැඟීමක්.

ඒ වගේම ගංවතුර නියඟ වැනි අවස්ථාවලදී අනෙක් ඕනෑම මූල්‍ය ආයතනයකට පෙර අපි ඒ තැන්වලට ගිහින් අසරණ වූ ජනතාව වෙත ඒ මොහොතේ දී කළ හැකි උදව් උපකාර නොපිරිහෙලා ඉටු කරන නිසා මේ ප්‍රදේශවල ජනතාව තුළ අප පිළිබඳව තිබෙන්නේ ඔවුන්ගේ සැපේදී වගේම දුකේදීත් ඔවුන් සමඟම සිටින සමාගමක් කියන හැඟීමයි.

අඳුර දුරලන සොඳුරු මෙහෙවරක යුතුකම සිය ගනුදෙනුකරුවන් වෙනුවෙන් ඉටු කිරීමේ මහා යුග මෙහෙවරකට ඇප කැප වී සිටින පදවිය ශාඛාව සිය ජීවිතයේ හෙට දවස ජය ගැනීම උදෙසා තම දහදිය කඳුළු හෙලන සුවහසක් දිරිය මිනිසුන් උදෙසා සිදුකරන මනුසත් මෙහෙවරට මේ සේවාවේ පහස ලබන සියල්ලන්ගේ ආශිර්වාදය හිමිවනු නිසැකය.



### M. P. S. නුවන් මන්ත්‍රිපති

**HNB** ග්‍රාමීන් සමාගමේ ණය විධායක නිළධාරියෙක් විදිහට දැනට මම සේවය කරනවා. මම ග්‍රාමීන් සමාගමට බැදුනේ මීට අවුරුදු පහමාරකට විතර කලින්. මධ්‍යස්ථාන දහසයක පමණ කටයුතු සිදුවන්නේ මගේ අධීක්ෂණය යටතේ. මේ කටයුතු වලට අමතරව අපිට නිකවැරටිය ශාඛාව මගින් භාර දී ඇති තවත් ඉලක්කයක් තමයි මාසෙකට යාළු ගිණුම් සඳහා රු.35000 වැඩි කලෙක්ෂන් එකක් කරවීම සඳහා අවශ්‍ය ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම් සිදු කිරීම. අනෙක් සියලුම ඉලක්කයන් සපුරා ගන්නා අතරේ අපි මේ ඉලක්කයත් සපුරා ගැනීමේ දැඩි අධිෂ්ඨානයක හිටියා. තවත් එකක් කියන්න ඕන. ප්‍රධාන කාර්යාලයෙන් මේ වගේ තරගකාරී ඉලක්කයක් භාරදෙන්නට පෙර ඉදන් අපේ ශාඛාව යාළු ගිණුම් ප්‍රවර්ධනය සඳහා මෙවන් තරගයක් සැලසුම් කර මාසික ඉලක්කය සපුරණ අයට කිසියම් තිළිණයක් දී ඔවුන්ව දිරිමත් කිරීමේ වැඩපිළිවෙලක් තිබුණා. මේ නිසා මේ අභියෝගයට අපිට තරගකාරීව මුහුණු දීම වඩාත් පහසු වුණා. පසුගිය ගිණුම් වර්ෂය තුළ පමණක් රුපියල් දසලක්ෂ අනුදෙදහස් පන්සිය දාහතක මුදලක් යාළු ගිණුම් තුළ ඉතිරි කරවන්න අවශ්‍ය දිරිගැන්වීම සහ පෙළඹවීම කරන්න මා හට හැකි වුණා.



### H. M. S. චන්දිම හේරත්

මම ක්ෂේත්‍ර විධායක නිළධාරියෙක් විදිහට **HNB** ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුනේ 2014 අවුරුද්දේ. ප්‍රධාන කාර්යාලයෙන් ලබා දුන්නු ඉලක්ක වලට අනුව මාසෙකට රු. 40,000 විතර ඉතුරුම් ඉලක්කයක් මට තිබුණා. මම අපේ මධ්‍යස්ථාන වලදී නිරන්තරයෙන් ඉතිරිකිරීමේ ඇති වැදගත්කම පිළිබඳව අපේ සාමාජිකාවන්ව දැනුවත් කළා. මටත් පොඩිකාලේ ළමා ගිණුමක් තිබුණා. මම මුලින්ම රස්සාවට එද්දි වැඩට එන්න අවශ්‍ය මුදල් ඇඳුම් පැලදුම් ගන්න ආහාර නවාතැන් ආදියට අවශ්‍ය මුදල් මම හොයාගත්තේ මගේ ඉතුරුම් ගිණුමේ තිබුණු සල්ලි අරන්. මම මගේ මේ සත්‍ය ජීවිත අත්දැකීම මධ්‍යස්ථාන සාමාජිකාවන්ට කිව්වා. දරුවෙකුගේ ළමා ගිණුමක් තිබීමේ වැදගත්කම. ඒක ඔවුන්ගෙ අනාගතයට ප්‍රයෝජනවත් වෙන විදිහ මම කිව්වා. මගේ කතාව අහලා ඒ ගැන ගැඹුරට හිතපු දෙමව්පියෝ **HNB** ග්‍රාමීන් ,යාළු, ළමා ගිණුමේ මුදල් තැන්පත් කරන්න පෙළඹුණා. ඒ වගේම සල්ලි තැන්පත් කරන්න. ඔවුන් විශාල මුදලක් වියදම් කරගෙන ග්‍රාමීන් එකට එන්න ඕන වෙන්නේ නෑ. අපේ නිළධාරින් අපේ ගනුදෙනුකරුවන් ළඟටම ගිහින් රු. 50 - 100 වගේ මුදල පවා ඉතුරුම් ලෙස ලබා ගන්නවා. මම මේ විස්තරයත් මධ්‍යස්ථානවල කිව්වා. අතේ තියෙන විදිහට රු. 50 - 100 හරි දාලා තමන්ගේ දරුවන්ට කියක් හරි ඉතිරි කරන එක යහපත් දෙයක් කියලා තේරුම් අරගත්තු දෙමව්පියෝ යාළු ගිණුම වටා රොක් වුණා. රු. දස ලක්ෂ අසූ අට දාහක මුදලක් යාළු ගිණුම් සඳහා පසුගිය ගිණුම් වර්ෂය තුළ ලබා ගන්න මට පුළුවන් වුනේ මේ කැපවීම හා තව කෙනෙකුට උදව් කිරීමට පෙළඹුණ සිතුවිල්ල නිසයි.



### R.I.T. ඉෂාර සඳරුවන්

මැයි මාසේ 18 වෙනිදට මම ග්‍රාමීන් එකට ඇවිත් අවුරුද්ද සම්පූර්ණ වෙනවා. දැනට මම පුහුණුවෙන ණය නිළධාරියෙකු ලෙස සේවය කරනවා. පහුගිය අවුරුද්ද තුළ මට ලැබී තිබුණු ඉතුරුම් ඉලක්කය සපුරාගන්න හැකි උපරිම වෙහෙසක් මම ගත්තා. ඒ වෙහෙසේ ප්‍රතිඵලයක් විදිහට රු. අට ලක්ෂ නවදහස් අටසියයක් යාළු ඉතුරුම් තැන්පතු වශයෙන් ලබාගන්න මට පුළුවන් වුණා. මේ වගේ මුදලක් තම දරුවන්ගේ ඉතුරුම් ගිණුම් වලට දාන්න දෙමව්පියන්ව දිරිමත් කරන්න ඔවුන්ට ඉතුරුකිරීමේ ඇති අගය වටහලා දෙන්න මම මගේ කාලයෙන් උපරිම වෙලාවක් ගත්තා. ඒකෙ ප්‍රතිඵල තමයි මේ.



නැදුන්කර්නි සේවා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය

**අඳුරේදී නොපෙණුනත් හෙවනැල්ල කිසිවිටක තමා හැර නොයයි.**





ඔබ (NO)දන්න මම

# අළෙවි කරන්න ආපු දේට වඩා ඉල්ලුමක් මට ලැබුණා...

**- ඩිශාන් ඇන්ඩෲ,**
**ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ස්ථාවර තැන්පතු**

**සම්පූර්න නම ඃ-** ඩිශාන් ඇන්ඩෲ
**උපන් දිනය (කැමති නම්) ඃ-** 1979.05.18
**පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල ඃ-** මම මුලින්ම ගියේ මොරටුව සොයිසා මහා විද්‍යාලයට. ඒ විද්‍යාලයෙන් පහේ ශිෂ්‍යත්වය සමත්වෙලා මට මොරටුව වේල්ස් කුමර විද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථාව ලැබුණා. අපි ඒ කාලෙ ජීවත් වුණේ මොරටුවේ සොයිසාපුර අපේ තාත්තාගේ රැකියාව වුණේ සපත්තු නිෂ්පාදනය. ගෙදරම කොටසක තාත්තා පාවහන් නිෂ්පාදනය කළා.අපේ ගෙදර ඉඳන් වේල්ස් කුමර විද්‍යාලයට කි.මී. 5 විතර තියෙනවා. මේ දුර බොහෝවිට අපි ගියේ පයින්. ඒ බස් එකේ යන්න දුන්නු සල්ලි ඉතිරි කරගන්න ඕන නිසා.
**විෂය ඃ-** වාණිජ විෂයට කැමතියි. මම උසස්පෙළ කළෙත් වානිජ විෂය ධාරාවෙන්
**ක්‍රීඩාව ඃ-** පාපන්දු. ඉස්කෝලෙ කාලෙ 15 පහළ සහ 17 පහළ ෆුට් බෝල් කණ්ඩායම් දෙකේම මම ක්‍රීඩා කළා. 15 පහළ කණ්ඩායමේ උප නායකයා වුනෙත් මම.
**පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ ඃ-** ලොකු වෙලා කරන රස්සාවක් ගැන හරි මේ වගේ කෙනෙක් වෙනවා කියලා හරි හැඟීමක් කවදාවත් මට තිබුණෙ නෑ.
**මුල්ම රැකියාව සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව ඃ-** මම මුලින්ම රැකියාව කළේ HSBC එකේ. ඒකෙ ක්‍රෙඩිට් කාඩ් අංශයේ. 98 දී පාසැල් කාලය ඉවර වෙලා ගෙදර ඉන්දැද්දි පත්තරේක තිබුණු දැන්වීමකට අනුව මම HSBC එකේ ඉන්ටර්වීව් ගියා. ඒකෙන් පාස්වෙලා HSBC බැංකුවේ අවුරුදු තුනක් රැකියාව කළා. ඒ රැකියාව හොඳින් කරගෙන යන අතරෙ දවසක් මම ග්‍රාමින් සමාගමට ආවා එහි කාර්ය මණ්ඩලයට HSBC ක්‍රෙඩිට් කාඩ් පත හඳුන්වාදීම සඳහා. එතැනදි ග්‍රාමින් සමාගමේ විධායක නිළධාරියෙක් විදිහට කටයුතු කරපු වසන්ත මහතා මගෙන් ඇහැව්වා ග්‍රාමින් සමාගමේ ස්ථාවර තැන්පතු අංශයට බැඳිලා කටයුතු කරන්න කැමැතිද කියලා. ඒ ඉල්ලීමට අනුව කතා බහ කරලා 2004.06.14 වෙනිදා මම ග්‍රාමින් සමාගමේ සේවකයෙක් විදිහට ආයතනයට එකතුවුණා. මෙතෙක් වැඩ කරපු ආයතන දෙක අතරින් මම HNB ග්‍රාමින් සමාගමට වඩාත් කැමැති මම වැඩි කාලයක් රැකියාව කරපු තැන නිසා නෙවෙයි. ග්‍රාමින් සමාගමෙන් සමාජයට සිදුවන සේවාවට කොටස්කරුවකු වීමට ලැබීමත් මේ රැකියාව තුළින් සමාජයේ විවිධ තලවල මිනිසුන් හඳුනාගැනීමට ලැබීමත් නිසයි.
**ජීවිතේ අමතක නොවන සිද්ධිය ඃ-** 2009 අවුරුද්දෙ සෙලින්කෝ අර්බුදය මතුවූ අවස්ථාවේදි එහි අනුබද්ධ සමාගමක් වුණු ග්‍රාමින් සමාගමේ ස්ථාවර තැන්පතු ලෙස මුදල් ආයෝජනය කළ අපේ ගනුදෙනුකරුවනුත් කළබල වුණා. ඒ මොහොතෙදි ඔවුන්ගෙ කළබලය දරාගෙන බොහෝ ඉවසීමෙන් කටයුතු කරන්න අපිට සිද්ධ වුණා. මුදල් ඉල්ලපු අයට මුදල් දෙන්නත් අනිත් අයට ඇත්ත තත්වය පැහැදිලි කරදී අප කෙරෙහි තබා තිබූ විශ්වාස තවදුරටත් තහවුරු කරවන්නත් අප කටයුතු කළා. තම මුදල් ගැන බයෙන් හිටපු පිරිසක් ඒ විදිහට පාලනය කර ආයතනය වගේම ඔවුන්ගේ මුදල්ද ආරක්ෂා කරන්නට හැකිවීම ගැන සිතේ තියෙන්නේ කවදාවත් අමතක කළ නොහැකි තෘප්තිමත් මතකයක්.
**ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය ඃ-** ජීවිතයේ වඩාත්ම සතුටට පත්වුණේ මගේ පුත්තු දෙන්නා ස්ටෙෆාන් සහ ජොහාන් ඉපදුණු දවසේ. දුකට පත්වුණු දවස් තිබුණත් එහෙම මතක් කරලා කියන්න පුළුවන් විශේෂ දවසක් නෑ.
**අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව ඃ-** පාසැල් කාලය, වගකීම්වලින් මිදුණු ඒ ජීවිතය කොයි තරම් රහයිද
**ජීවිතයට අභිමි වුණු වටිනාම පුද්ගලයා හෝ අවස්ථාව ඃ-** මම ශිෂ්‍යත්වය පංතියේ ඉගෙන ගන්න කාලේ අපේ පංතිභාර ගුරුතුමා වුණු බණ්ඩාර සෙනෙවිරත්න සර්..ඔහු දක්ෂ ගුරුවරයෙක්. ඔහුගේ කැපවීම නිසාම අපේ පාසැලේ හුග දෙනෙක් ශිෂ්‍යත්වය සමත් වුණා. මම හතේ පංතියේ විතර කාලේ සර් අසනීපයකින් නැති වුණා. ඔහුගේ වියෝව මට හුගක් දැනුණා.
**හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා ඃ-** මගේ දුර්වලතා ඇති. ඒත් මම අතහැර ගත යුතුයි කියලා හිතෙන තරමට මට දැනෙන දුර්වලතාවයක් නෑ.
**ඔබ හිතන විදිහට ඔබ වඩාත්ම කුසලතාවන් ප්‍රකට කරන්නේඃ-** මම අළෙවි ක්ෂේත්‍රය තුළ මගේ දක්ෂතා ප්‍රකට කරලා තියෙනවා. මම හිතන්නේ මේක තමයි මගේ හැකියාවන්ට උචිත වෙන ක්ෂේත්‍රය
**ඔබේ ජීවිතයේදී හමුවූ වඩාත්ම ආකර්ශනීය පුද්ගලයා, ඔහුතුළ ඔබ දකින සුවිශේෂීතාවය ඃ-** මාධව එදුස්සූරිය මහතා. මාව ග්‍රාමින් එකට තෝරා ගත්තේ ඔහු.සමහර විට ඔහු එදා මාව තෝරා නොගත්තා නම් ග්‍රාමින් එකට මාව ආගන්තුකයෙකු පමණක් වෙන්නට තිබුණා. මාධව මහතා තුළ මා දුටු විශේෂත්වය ඔහුගේ ඉවසීම. අනෙක කණ්ඩායමක් හැසිරවීමේදී ඔහු දක්වන නායකත්ව ගුණාංග.
**පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම ඃ-** මම උසස්පෙළ කරන කාලේ අපේ නිවස කිට්ටුවම හිටපු තරුණියක් ගැන මගේ හිතේ විශේෂ කැමැත්තක් ඇතිවුණා. මගේ යාළුවෙක්ගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ්ගේ මිතුරියක නිසා මට එයාව හම්බවෙන්න අවස්ථාවත් හම්බ වුණා.ඒ ඇසුර අවසානයේ ආදරයකට පෙරලිලා මම ඇයව විවාහ කරගත්තා. ඇය ශාමිලා මුහීඩ්.
**එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂතාව ඃ-** මම මේ ගුණාංගයට කැමතියි කියලා එකපාරට කියන්න බෑ. ඇය හොඳ බිරිඳක්
**ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද ඃ-** ඇත්තටම.... මම මගේ ඉලක්ක ජය ගනිමින් සිටිනවා වගේම මෙතෙක් ඉටුනොවුණු බලාපොරොත්තු සැබෑකරගන්න වෙහෙසෙනවා. මෙතෙක් ගෙවුණු ජීවිතය ගැන සැබවින්ම මම තෘප්තිමත්.
**ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂ්‍යය (terning Point)ඃ-** 2004 වසර. ඒ මම ග්‍රාමින් සමාගමට ආපු වසර ජීවිතයට බොහෝදෑ එකතු කරගත්තේ ඉන්පස්සේ.
**ඔබේ ප්‍රියතම ගායකයා ඃ-** ගුණදාස කපුගේ
**ගීතය ඃ-** ඔහුගේ හුගක් ගීත වලට මම කැමැතියි
**චිත්‍රපටිය ඃ-** Fast and Furious
**කෘතිය ඃ-** ගම්පෙරලිය.
**අනාගත ඉලක්කය ඃ-** මගේම කියලා ගෙයක් හදාගෙන බිරිඳත් දරුවනුත් එක්ක සතුටෙන් ජීවත්වීම තමයි.





සටහන
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි

# දැනුම වඩන්නයි - තෑගි දිනන්නයි මෙහෙවර පැණසර

## ප්‍රහේලිකා අංක - 06

ජයග්‍රාහකයින් තිදෙනෙකුට සදීපා ප්‍රකාශකයෝ වෙතින් රුපියල් 3000 වටිනා පොත් කට්ටල තුනක්

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 ධා | | 3 | | ■ | 2 | | 8 |
| | ■ | | ■ | 6 | ■ | ■ | ■ |
| 4 | 5 | | | 7 ත | | | |
| | | ■ | ■ | | ■ | ■ | ■ |
| ■ | | ■ | 9 | 10 | ■ | 11 | ■ |
| 8 | | | ■ | | ■ | | ■ |
| | ■ | ■ | ■ | | ■ | 12 | |
| | ■ | 10 | | | | | |

නම : ............................ සේවක අංකය : ............................
ශාඛාව : ............................ ප්‍රහේලිකාව පිරවූයේ වෙනත් අයෙකු නම් ඔහුගේ / නම : ............................
ඥාති සම්බන්ධය : ............................
දිනය : ............................ අත්සන : ............................

**උපකාරක, හරහට**

1. රජවීමට පෙර මේ රජු පැවිදිව සිටියේ යැයි කියවේ.
2. ඇෆ්ගනිස්ථානයේ අගනුවර මේ නමින් හැඳින්වේ.
4. "ලෝහමය නොවන ඛනිජ" ගනයට වැටේ.
7. ක්ෂීරපායි ගනයට අයත්වන මුහුදේ වෙසෙන විශාල මත්ස්‍ය විශේෂයකි.
8. ලංකාවේ පළාත් නවයෙන් එකකි.
9. පුරාණ සිංහල වී විශේෂයකි.
10. "දේශපාලන විද්‍යාවේ පියා" යනුවෙන් හැඳින්වෙනුයේ මොහුය.
12. ගොරෝසු යන අරුත් දේ.

**පහලට**

1. දැහැමි යන්නට තවත් වචනයකි.
3. "මළහිරු බසිනා සැන්දෑ යාමේ"ගීතය මොහුගේ පද රචනයකි
5. කඳු දෙකක් අතර පිහිටි පහත් භූමිය මෙනමින් හැදින්වේ.
6. "කොස් මාමා" යන අන්වර්ථනාමයෙන් හැඳින්වූයේ මොහුය.
8. .........යන තරමට ආයුෂ අඩුවේ.
11. මෙරට යන්නට විරුද්ධ අදහසක් දේ.

මෙහෙවර පැණසර ප්‍රහේලිකාවේ බහුතරයක් උපකාරකයන් සැකසෙනුයේ මෙවර මෙහෙවර පුවත්පතේ පළව ඇති ලිපි වල අඩංගු කරුණු ඇසුරිනි. එම ලිපි කියැවූ ඔබට මෙම ප්‍රහේලිකාව පිරවීම කිසිසේත්ම අසීරු නොවනු ඇත. HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට මෙම තරඟය සඳහා සහභාගී විය හැකි අතර නිවැරදිව ප්‍රහේලිකාව පුරවා එවන්නන් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගන්නා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් තිදෙනෙකුට සදීපා පොත් ප්‍රකාශකයෝ වෙතින් අගනා පොත් පාර්සල් 3 ක් පිරිනමන අතර, ඔබගේ විසඳුම් ලබන මස 3 වන සතියට පෙර සංස්කාරක - මෙහෙවර පැණසර, HNB ග්‍රාමීන් අංක 168, නාවල පාර, නුගේගොඩ ලිපිනයට ලැබෙන්නට සලස්වන්න.

## මේ අයත් නිවැරදි විසඳුම් එවා තිබුණා

එම්.යූ.එස්. ධර්මවර්ධන ප්‍රධාන කාර්යාලය, කේ.ආර්.බී.එස්. ගුණවර්ධන ගම්පහ ශාඛාව, චතුරංග මැදවච්චිය ශාඛාව, සුජිත් කුමාර ප්‍රධාන කාර්යාලය, අමල් තිලංක ප්‍රධාන කාර්යාලය, තිළිණි කල්පනා ප්‍රධාන කාර්යාලය, කේ.සුමිත් චාමර ඇඹිලිපිටිය ශාඛාව, තිළිණ දිසානායක ප්‍රධාන කාර්යාලය, එම්.සී.එස්. විජේරත්න බලංගොඩ ශාඛාව, සුනන්ද මෙන්ඩිස් ප්‍රධාන කාර්යාලය, එච්.ඩී.සමින්ද ප්‍රධාන කාර්යාලය, එස්.පී.එන්.එම්.යසරත්න හෝමාගම ශාඛාව, අයි.එල්.සංජීව ප්‍රධාන කාර්යාලය, ඊ.ඒ.පී.අයි. ලාල් ගම්පහ ශාඛාව, එස්.එස්.එස්.සුසන්ත බලංගොඩ ශාඛාව, එම් අයි. උමයංග බලංගොඩ ශාඛාව, එම්.පී.සී.ටී. ගුණවර්ධන හලාවත ශාඛාව, ඩබ්.ක්‍රිශාන් ප්‍රධාන කාර්යාලය, එස්.පී...කේ.සී ගුණවර්ධන රිකිල්ලගස්කඩ, එච්.එම්.අමරසිංහ හලාවත ශාඛාව, කේ.එම්.ආර්.ඩී.බණ්ඩාර නාවලපිටිය ශාඛාව,පී.එම්.ආර්.කුලතුංග හලාවත ශාඛාව, යූ.අයි.ඩී.ඒ. විජේරත්න හලාවත ශාඛාව, නිමල් රාජකරුණා හෝමාගම ශාඛාව

## මෙහෙවර පැණසර පසුගිය කලාපයේ ජයග්‍රහකයෝ

HNB ග්‍රාමීන් මෙහෙවර පුවත් සඟරාවේ මාර්තු - අප්‍රේල් කලාපයේ "පැණසර" ප්‍රහේලිකාව විසඳා එවා ජයග්‍රහණය කළ ජයග්‍රාහකයන්ගේ නම් පහත පළ වේ. සදීපා ප්‍රකාශකයන් විසින් පිරිනමනු ලබන රු. 3000 වටිනා පොත් කට්ටල නුදුරු දිනකදීම ඔබ වෙත ලැබෙනු ඇත. අපේ උණුසුම් සුබ පැතුම්...


උපිත් දුෂ්මන්ත විජේසේකර
හලාවත ශාඛාව


අමල් තිලංක
ප්‍රධාන කාර්යාලය


ඉෂාර උමයංග
බලංගොඩ ශාඛාව



මෙහෙවර පැණසර ප්‍රහේලිකාව පරවා එවීමට ඔබ දක්වන උනන්දුව දිනෙන් දිනම ඉහළ යන බව සීඝ්‍රයෙන් වැඩිවන ඔබේ විසදුම් පත් ප්‍රමාණය සාක්ෂි දරනවා.පසුගිය කලාපයේ පළවූ මෙහෙවර පැණසර ප්‍රහේලිකාව පුරවා එවූ ඔබ අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගත් ජයග්‍රහකයින් තිදෙනාගේ නම් ඉහත දැක්වෙනවා. මෙවර මෙහෙවර ජයග්‍රහකයින් තේරීම සඳහා අප හා එක්වූ බොරැල්ල සදීපා ප්‍රකාශන ආයතනයේ අධිපති සරත්චන්ද්‍ර වන්නිඅච්චි මහතාටත් ප්‍රකාශන කළමනාකාරිනී ලක්මාලි එගොඩගමගේ මෙනෙවියටත් අපගේ ස්තූතිය.

සදීපා
සම්මානලාභී බෞද්ධ, සාහිත්‍ය හා අධ්‍යාපන පොත් ප්‍රකාශකයෝ
Sole Agent in Sri Lanka
PELANGI
Penerbitan Sdn. Bhd.
Malaysia.
කුඩා ළමුන්ට මුල සිට සරලව ඉංග්‍රීසි ඉගෙනීම සඳහා මැලේසියාවෙන් ගෙන්වන Phonics පොත් පෙළ
• පොත් ප්‍රකාශනය • ප්‍රින්ට් හවුස්
• පොත් හල • ප්‍රින්ටර්ස්
ස්/ස සදීපා ප්‍රකාශකයෝ
SADEEPA PUBLISHERS (PVT) LTD
1060, මරදාන පාර, බොරැල්ල
දුරකථන : 011-2686114, 2694289, 2678043
ෆැක්ස් : 011-2678044
Email : sadeepapub@gmail.com

# සිත්තර යාළු පුංචි අපේ චිත්‍ර පිටුව

''සිත්තර යාළු'' චිත්‍ර පිටුව වෙන්වෙලා තියෙන්නේ එච් එන් බී ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළි දැක්වීම පිණිසයි. ''සිත්තර යාළු චිත්‍ර පිටුවෙහි පළවන චිත්‍ර අතරින් **තෝරා ගනු ලබන හොඳම චිත්‍ර තුනක් සඳහා සිලෝන් පෙන්සිල් කොම්පැණි (ඇට්ලස්) මගින් පිරිනමනු ලබන වටිනා ත්‍යාග කට්ටල තුනක් පිරිනමනු ලබන** අතර ඔබගේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළිදක්වාලීමට ලැබෙන මේ මාහැඟි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන **ඔබේ දරුවාගේ චිත්‍ර නිර්මාණ සංස්කාරක, චිත්‍ර පිටුව, එච් එන් බී ග්‍රාමීන් ගොඩනැගිල්ල, අංක 168, නාවල පාර , නුගේගොඩ. යන ලිපිනයට නොපමාව යොමු කරන්න.**



**හිස තෙල් ගෑමේ උත්සවය**
**උතුල් බුද්මිණ තන්ත්‍රිගේ - 3-ශ්‍රේණිය B**
**(මාම්පේ කනිෂ්ඨ විද්‍යාලය - පිලියන්දල)**



**මගේ ගෙවත්ත**
**ඩියෑන් රත්නායක - 1-ශ්‍රේණිය A**
**(ශාන්ත ජෝෂප් බාලිකා විද්‍යාලය - ගම්පොළ)**



**වනයක අසිරිය**
**ආර් ඒම් ලකිඳු තේනුර - 9ශ්‍රේණිය**
**(මහින්ද තිස්ස - ප්‍රධාන කාර්යාලය)**



**අක්කයි නංගියි මමයි**
**මෙතායා හිමංදී - 2ශ්‍රේණිය**
**(සුදේශ් පෙරේරා - ප්‍රධාන කාර්යාලය)**



**මගේ මාලු ටැංකිය**
**ටි එම් සෙනුම් යුතාරා දම්සරණි**
**(ටි එම් ආර් ප්‍රේමලාල් - හලාවත ශාඛාව)**

## "Atlas සිත්තරයාළු"

මෙහෙවර සිත්තර යාළු පසුගිය කලාපයේ ජයග්‍රාහී දූ පුතුන්

- **මුහුදු වෙරළ**
  **පී රනුලයා මුදලිගේ**
  **(උදය මුදලිගේ- හොරණ ශාඛාව)**

- **මගේ ගම**
  **වෙනුෂි ෂෙහානී**
  **(අදාල ත්‍යාගය එවීම සඳහා ශාඛාවේ සහ බාරකරුගේ නම දන්වා එවන්න)**

- **නංගී සමග සෙල්ලම් කරනවා**
  **එම්. හසිඳු ප්‍රහර්ෂ ප්‍රනාන්දු**
  **(එම්. දමිත් සංජීව - මතුගම ශාඛාව)**

## මෙහෙවර පසුගිය කලාපයන්හි ජයග්‍රාහී දූ පුතුන්

**මෙහෙවර සිත්තර යාළු වෙත චිත්‍ර ඇඳ එවා පසුගිය නොවැම්බර් - දෙසැම්බර්/ ජනවාරි - පෙබරවාරි කලාපයන් හි ජයග්‍රහනය ලැබූ වාසනාවන්ත දු දරුවන් 6 දෙනා අතරින් පහත නම් සඳහන් දරුවන් 4 දෙනා තමන් ලද ත්‍යාගය සමඟ ඡායාරූප අපවෙත ඒවා තිබුණා. ජයග්‍රහණය ලද වාසනාවන්ත දරුවන් සියලු දෙනාටම අපගේ උණුසුම් සුභපැතුම්.**



ඉසුක අමෝද ද අල්විස්



සේහානි හංසනා



නේත්‍රා අබිමානි



දිනිති ඉමාසා අබේසේකර

**සෑම දෙයකටම මූල ධර්මයක් ඇත. එය දැනගැනීම ඉතා වැදගත්ය.**



HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් ශාඛා ජාලයෙහි 33 වන ශාඛාව වූ HNB ග්‍රාමීන් හම්බන්තොට ශාඛාව පසුගිය අප්‍රේල් 05 වන දින නව නිවහනකට ගෙවදින ලදි.

# HNB ග්‍රාමීන් හම්බන්තොට ශාඛාව නව නිවහනකට

මෙතෙක් නො 46 ඒ, තංගල්ල පාර, හම්බන්තොට යන ලිපිනයෙහි සිය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන ගිය හම්බන්තොට ශාඛාව මෙතැන් සිට නො 21 ඒ, ජේල් ස්ට්‍රීට්, හම්බන්තොට යන ලිපිනයෙහි සිය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබයි. නව නිවහනට ගෙවදීම වෙනුවෙන් පැවැත්වූ උත්සව අවස්ථාවට HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් හි කළමනාකාර අධ්‍යක්ෂක /ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි විය. මෙම අවස්ථාවට, HNB ග්‍රාමීන් ලිමිටඩ්හි ප්‍රධාන මෙහෙයුම් නිළධාරී ප්‍රියලාල් අරංගල නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඈනස්ලි ප්‍රනාන්දු යන මහත්වරුන් ඇතුළු HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි නිළධාරීහු, සහ ගනුදෙනුකාර භවතුන් විශාල පිරිසක් සහභාගී වූහ.

එදින එම අවස්ථාවට සමගාමීව ගනුදෙනුකාර භවතුන් විසින් නව යාළු ගිණුම්, ඉතුරුම් ගිණුම් සහ ස්ථාවර තැන්පතු විශාල ප්‍රමාණයක් ආරම්භ කළ අතර ශාඛාව නව ස්ථානයකට ගෙන යාම නිමිතිකර ගනිමින් පසුගිය වසරේ සාමාන්‍යපෙළ විභාගයෙන් විශිෂ්ඨ සම්මාන අටක් සහිතව සමත් වූ HNB ග්‍රාමීන් සාමාජිකාවකගේ දියණියකට අධ්‍යාපනික උපකරණ සහිත වටිනා පොත් පාර්සලයක් ප්‍රදානය කිරීම කළමනාකාර





අධ්‍යක්ෂක තුමන් අතින් සිදුකෙරුණු අතර මීට සමගාමීව විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක්ම හම්බන්තොට සහ අම්බලන්තොට නගර කේන්ද්‍ර කරගනිමින් පැවැත්වූ බව හම්බන්තොට ශාඛා කළමනාකාර විජිත් කටුවනආරච්චි මහතා මෙහෙවරට පැවසීය.

# ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින් "HNB ග්‍රාමීන්" කාන්තාව සතු සමාජ කාර්යභාරය අගයයි



"නිරෝගීමත් පවුලක් තුළින් සමෘද්ධිමත් සමාජයක් බිහිකරලමු" යන මැයෙන් කාන්තා දින විශේෂ සමරු වැඩසටහනක් පසුගිය මාර්තු 08 වන දින HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් මගින් සංවිධානය කරන ලදි. සමාජ යහපත සහ අභිවෘද්ධිය නිරතුරුව අපේක්ෂා කරන HNB ග්‍රාමීන් සමාගම මෙවර කාන්තා දිනය වෙනුවෙන් සංවිධානය කරන ලද වැඩසටහනෙහි මුඛ්‍ය තේමාව වුයේ නිවැරදි ආහාර පරිභෝජන රටාවක් පවත්වා ගැනීම සහ නිවැරදි ව්‍යායාම රටාවක් පවත්වා ගැනීම තුළින් මනා සෞඛ්‍යසම්පන්න පවුල් ඒකකයක් බිහිකරලමු යන්නයි.

බත්තරමුල්ල "අපේ ගම" රංගශාලා පරිශ්‍රයේදී කාන්තාවන් 600 කගේ සහභාගීත්වයෙන් පවත්වන ලද මෙම දැනුවත් කිරීමේ වැඩසටහන මෙහෙයවන ලද්දේ එංගලන්තයේ රාජකීය වෛද්‍ය සභාවේ විශේෂඥ වෛද්‍ය අසංග විජේරත්න මහතා විසිනි. මීට අමතරව නිවැරදි ආහාර පරිභෝජන රටාවක වැදගත්කම පහදමින් ආහාර පුරුදු සහ ආහාර පාලනය පිළිබඳව කෙටි දේශනයක් උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ වෛද්‍ය පීඨයේ ආචාර්ය සුරේඛා චක්‍රවර්ති මහත්මිය විසින් පවත්වන ලදී.



එදින මෙම වැඩසටහන සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස HNB ග්‍රාමීන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා සහභාගී වූ අතර සෙසු ආරාධිතයන් ලෙස අධ්‍යක්ෂිකා ක්‍රිෂාන්ති තම්බයියා,ප්‍රධාන මෙහෙයුම් නිළධාරී ප්‍රියලාල් අරංගල,නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් වන ඈනස්ලි ප්‍රනාන්දු,බිමල් සෙනෙවිරත්න යන මහත්ම මහත්මීන් ඇතුළු නිළධාරීහු සහභාගී වූහ.

HNB GRAMEEN මෙහෙවර
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර
නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් : 0112825843
ඊ-මේල් :- manjula.p@hnbgrameen.lk

අධීක්ෂණය :- චමින්ද ප්‍රභාත්
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- කණිෂ්ක විජේතුංග
ඡායාරූප ශිල්පි :- ලක්ෂ්මන් කුමාරතුංග
මුද්‍රණය :- අර්ජුන ග්‍රැෆික්ස්

## Happy Birthday

මැයි - ජූනි මාස වල උපන්දිනය සමරන
එච් එන් බී ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත
අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමග පිරිනමමු !

| නම | දිනය | ශාඛාව |
|---|---|---|
| දිනේෂ් තරංග මහතා | මැයි 22 | ප්‍රධාන කාර්යාලය |
| ඉංදික සඳරුවන් මහතා | මැයි 22 | ප්‍රධාන කාර්යාලය |
| චාමර වගාආච්චි මහතා | මැයි 22 | තිස්සමහාරාමය |
| ටී. ජෝන් මහතා | මැයි 22 | මල්ලාවි |
| බී කිශාන්ත මහතා | මැයි 23 | මඩකලපුව |
| සුමුදු සුදර්ශන මහතා | මැයි 23 | ප්‍රධාන කාර්යාලය |
| නිශාන්ත ප්‍රදීප් මහතා | මැයි 23 | මැදවච්චිය |
| ඉරුමි රන්දෙණිය මහත්මිය | මැයි 23 | ප්‍රධාන කාර්යාලය |
| කුමාරසාමි පවිරාජ් මහතා | මැයි 23 | යාපනය |
| වරින්ද විජේසිංහ මහතා | මැයි 23 | හෝමාගම |
| හෂාන් සිල්වා මහතා | මැයි 23 | පොළොන්නරුව |
| දුෂාන්ත ජයවර්ධන මහතා | මැයි 23 | නගර ශාඛාව |
| තාරක සිල්වා මහතා | මැයි 23 | නුවරඑළිය |
| සුමුදු තුෂාර මහතා | මැයි 24 | මාතර |
| දිනේෂ් රංජන් මහතා | මැයි 24 | ජාඇල |
| අසංක දිසානායක මහතා | මැයි 24 | නුවර එළිය |
| අනෝමා මල්කාන්ති මෙනෙවිය | මැයි 24 | ප්‍රධාන කාර්යාලය |
| තිළිණ ජයසූරිය මහතා | මැයි 24 | නුවර |
| ටී. තම්බිරාජා මහතා | මැයි 24 | මඩකලපුව |
| ඩිල්ෂාන් පෙරේරා මහතා | මැයි 24 | ගාල්ල |
| ටී.ජී.ඉෂාණි මෙනෙවිය | මැයි 25 | මාතර |
| ප්‍රියන්ත කුමාර මහතා | මැයි 25 | පොතුවිල් |
| මධුශංඛ හේරත් මහතා | මැයි 25 | හැටන් |
| චාමර මුදන්නායක මහතා | මැයි 25 | නිට්ටඹුව |
| ලහිරු මධුශංක මහතා | මැයි 25 | හම්බන්තොට |
| කපිල අබේගුණවර්ධන මහතා | මැයි 26 | කෑගල්ල |
| අජිත් ප්‍රේමකීර්ති මහතා | මැයි 26 | බදුල්ල |
| කේ . ශ්‍රී කාන්තන් මහතා | මැයි 26 | මල්ලාවි |
| කේ . බාලචන්ද්‍රන් මහතා | මැයි 26 | කිලිනොච්චි |
| රොහාන් බුද්ධික මහතා | මැයි 26 | ත්‍රිකුණාමලය |
| පද්මසිරි දයාවංශ මහතා | මැයි 26 | ප්‍රධාන කාර්යාලය |
| ඉංදික දෙල්පිටිය මහතා | මැයි 26 | ප්‍රධාන කාර්යාලය |
| දුලාංජන ගම්ලත් මහතා | මැයි 27 | කුලියාපිටිය |
| තාරක රණබාහු මහතා | මැයි 27 | අම්බලන්ගොඩ |
| ඒ රෙජිනෝල්ඩ් මහතා | මැයි 28 | මන්නාරම |
| ජනිත් ප්‍රශාන්ත මහතා | මැයි 28 | කඩුවෙල |
| එස්. සකීලන් මහතා | මැයි 28 | කිලිනොච්චි |
| ශාන්ත කුමාර මහතා | මැයි 29 | අම්පාර |
| නුවන් ප්‍රියදර්ශන මහතා | මැයි 29 | මාතර |
| සුජිත් අනුර මහතා | මැයි 29 | ප්‍රධාන කාර්යාලය |
| ඩී. මර්වින් මහතා | මැයි 29 | ත්‍රිකුණාමලය |
| ටී. ඇන්ටන් මහතා | මැයි 29 | කිලිනොච්චි |
| අසිත සංජීව මහතා | මැයි 29 | හලාවත |
| දිමුතු තරංග මහතා | මැයි 29 | කළුතර |
| සංජීව ජයසුන්දර මහතා | මැයි 29 | නිකවැරටිය |
| දිනුක සමරසිංහ මහතා | මැයි 29 | බදුල්ල |
| අරුණ ප්‍රියශාන්ත මහතා | මැයි 30 | බදුල්ල |
| කපිල තෙන්නකෝන් මහතා | මැයි 30 | හලාවත |
| ඉසුරු ධනුෂා මහතා | මැයි 30 | අවිස්සාවේල්ල |
| වික්මල් දිසානායක මහතා | මැයි 30 | කුරුණෑගල |
| අසංක චන්ද්‍රසේන මහතා | මැයි 30 | නුවරඑළිය |
| අනිල් සංජීව මහතා | මැයි 31 | මහියංගනය |
| කපිල ධර්මසේන මහතා | ජූනි 01 | අවිස්සාවේල්ල |
| ශමිණි තාරිකා මෙනෙවිය | ජූනි 01 | ප්‍රධාන කාර්යාලය |
| කුෂාන්ත චමින්ද මහතා | ජූනි 02 | වැලිමඩ |
| සනත් ප්‍රියංකර මහතා | ජූනි 02 | අනුරාධපුර |
| මධුශංක වෑකඩපොල මහතා | ජූනි 02 | රිකිල්ලගස්කඩ |
| ඩිලාන් චම්පික මහතා | ජූනි 02 | හොරණ |
| ජේ. අභිමානකුමාර් මහතා | ජූනි 02 | මුලතිව් |
| නලීන් දුෂ්මන්ත මහතා | ජූනි 02 | මාතලේ |
| මොහොමඩ් හිසාන් මහතා | ජූනි 02 | ත්‍රිකුණාමලය |
| තිළිණ ප්‍රියංකර මහතා | ජූනි 03 | ඇඹිලිපිටිය |
| නයන කුමාර මහතා | ජූනි 03 | නුවරඑළිය |
| අරවින්ද අකලංක මහතා | ජූනි 04 | අම්පාර |
| හර්ෂ බණ්ඩාර මහතා | ජූනි 04 | කන්තලේ |
| සංජීව ප්‍රදීප් මහතා | ජූනි 05 | පදවිය |
| නිරෝෂන් හේරත් මහතා | ජූනි 06 | නගර ශාඛාව |
| එම් ලිවරාසන් මහතා | ජූනි 06 | මඩකලපුව |
| එන්. නන්තාපලන් මහතා | ජූනි 06 | නෙල්ලිඅඩි |
| නුවන් සංජීව මහතා | ජූනි 07 | ගලෙන්බිදුණුවැව |
| චතුරිකා මධුෂානි මෙනෙවිය | ජූනි 07 | ප්‍රධාන කාර්යාලය |
| සම්පත් කුමාර මහතා | ජූනි 07 | බෙලිඅත්ත |
| ලහිරු බණ්ඩාර මහතා | ජූනි 07 | කුරුණෑගල |
| බසුන් බණ්ඩාර මහතා | ජූනි 07 | අනුරාධපුර |
| ලසානි දිහිනි මෙනෙවිය | ජූනි 07 | ප්‍රධාන කාර්යාලය |
| සත්වීගන් මහතා | ජූනි 07 | මඩකලපුව |
| ලක්ෂ්මන් එරාජ් මහතා | ජූනි 08 | ප්‍රධාන කාර්යාලය |
| ඩබ්. පී. සුරංග මහතා | ජූනි 08 | මීගමුව |
| නුවන් ඉංදික මහතා | ජූනි 08 | හොරණ |
| නුවන් ප්‍රදීප් මහතා | ජූනි 08 | මොරවක |
| ගයාන් පෙරේරා | ජූනි 08 | මීගමුව |
| එම්. ජෙයදර්ශන් මහතා | ජූනි 09 | ත්‍රිකුණාමලය |
| ප්‍රදීප් කුමාර මහතා | ජූනි 09 | මොනරාගල |
| කෙ. රාසයියා මහතා | ජූනි 09 | නෙල්ලිඅඩි |
| ගමගේ චතුර මහතා | ජූනි 09 | ගාල්ල |
| ඉමේෂ් මධුශංක මහතා | ජූනි 09 | මොනරාගල |
| කේ ශ්‍රීධරන් මහතා | ජූනි 10 | වවුනියා |
| ඇන්ටන් වෝල්ටා මහතා | ජූනි 10 | නොරොච්චෝලෙ |
| යෝගනාදන් සුදේශන් මහතා | ජූනි 10 | කල්මුණේ |
| සමීර මධුශංක මහතා | ජූනි 10 | කන්තලේ |
| දීපාල් සංජීව මහතා | ජූනි 10 | ඇඹිලිපිටිය |
| රංදික දුල්ෂාන් මහතා | ජූනි 10 | පොළොන්නරුව |
| ස්වර්ණමාලි ආරියරත්න මෙනෙවිය | ජූනි 10 | පුත්තලම |
| සුනිල් පෙරේරා මහතා | ජූනි 11 | හොරණ |
| මහේෂ් සජීවන් මහතා | ජූනි 11 | ජාඇල |
| මහේෂ් කුමාර මහතා | ජූනි 11 | මාතර |
| සමන් කුමාර මහතා | ජූනි 11 | පදවිය |
| නලින් මධුශාන් මහතා | ජූනි 11 | හලාවත |
| ෆ්‍රෑන්ක්ලින් ඇන්තනී මහතා | ජූනි 11 | ප්‍රධාන කාර්යාලය |
| තිලක්ෂිත සංකල්ප මහතා | ජූනි 11 | දෙහිඅත්තකණ්ඩිය |
| එරංද ශ්‍රී ප්‍රියංග මහතා | ජූනි 12 | නුවර |
| සංජීව ප්‍රදීප් මහතා | ජූනි 12 | බදුල්ල |
| ටී.නර්මදන් මහතා | ජූනි 12 | නැදුන්කර්ණි |
| නිරංජන් සෙනරත් මහතා | ජූනි 13 | රිකිල්ලගස්කඩ |
| දිනේෂ් රුවන් කුමාර මහතා | ජූනි 14 | බෙලිඅත්ත |
| සංජය බණ්ඩාර මහතා | ජූනි 14 | මාතලේ |
| චින්තන සුරේෂ් කුමාර මහතා | ජූනි 14 | කුරුණෑගල |
| එස්. වර්ණන් මහතා | ජූනි 14 | මුලතිව් |
| ජේ. සජීවන් මහතා | ජූනි 14 | වවුනියා |
| අජිත් ප්‍රසන්න මහතා | ජූනි 15 | මොනරාගල |
| ටී තවනේශ්වරන් මහතා | ජූනි 15 | අම්පාර |
| ශාලික රජිත් මහතා | ජූනි 15 | අවිස්සාවේල්ල |
| දිශාන් කල්හාර මහතා | ජූනි 15 | බණ්ඩාරගම |
| චමින්ද පුෂ්පකුමාර මහතා | ජූනි 16 | ප්‍රධාන කාර්යාලය |
| ඩිෂාන් චමින්ද මහතා | ජූනි 16 | ප්‍රධාන කාර්යාලය |
| ජනිත් ජයසිංහ මහතා | ජූනි 16 | හෝමාගම |
| ජනිත් පෙරේරා මහතා | ජූනි 16 | කුරුණෑගල |
| සුමිත් දිසානායක මහතා | ජූනි 16 | ගල්ගමුව |